# විශේෂ මහ සභා රැස්වීම - 2022/12/14දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/12/14වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ විශේෂ මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තෑව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අද දින විශේෂ මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත්, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මෙම සභාව නියෝජනය කරන පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා 15 දෙනෙකු විසින් 2022/12/04 දින අත්සන් තබා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විවාදයකට අවස්ථාවක් ලබාගැනීමට විශේෂ සභාවක් කැඳවා දෙන ලෙස දන්වමින් ලිපියක් 2022/12/08 දින අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය වෙත යොමුකර අනතුරුව මා වෙත යොමුකරන ලදි. ප්‍රාදේශීය සභා රැස්වීම් පවත්වාගන යාමේ රීතිමාලාවේ විධිවිධාන අනුව යමින් අද දින මෙම විශේෂ රැස්වීම පවත්වන අතර ඒ අනුව විවාදයට ඔබතුමන්ලාට අවස්ථාව ලබාදෙනවා.

ලිපිය යොමු කර ඇති ගරු මන්ත්‍රීවරුන් -

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති | ඩබ්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.ඒ කරුණාරත්න මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය |

<u>ලිපියේ සඳහන් කරුණු</u>

1. අලව්ව ප්‍රාදේශීය සභාවේ NW PF-7468 දරණ කැබ්රථය 2022.05.09 වෙනි දින නීති විරෝධී ක්‍රියාවක් සඳහා කොළඹ කරා ධාවනය කල බව අප දන්නා කරුණකි. එම කරුණු සම්බන්ධයෙන් 2022.05.24 දින පැවැත්වූ මහ සභාවේදී කරුණු ඉදිරිපත් කරන ලද නමුත් අප සභාව සතු උක්ත අංක දරණ කැබ් රථය සම්බන්ධයෙන් මෙතෙක් ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග කිසිවක් සභාවට පවසා නැත. තවද එම කැබ් රථය මෙම වර්ෂය අවසන් වීමට පෙර කුමක් කරන්නේද යන්න පිළිබඳවත් මහ සභාවට මෙතෙක් කරුණු ඉදිරිපත් කර නැත. ඒ අනුව සභාවේ මන්ත්‍රීවරුන් වන අප විසින් පහත අත්සන් කර ඉල්ලා සිටිනු ලබන්නේ ප්‍රාදේශීය සභා නීතිය අනුව විශේෂ මහ සභාවක් කැඳවා විවාදයට අවස්ථාවක් ලබාදෙන ලෙසය.

2. සභාවේ ලේකම්වරිය විසින් තමන්ගේ නිවස කරා යාම සඳහා භාවිතා කරන ප්‍රාදේශීය සභාවේ කැබ්රථය සම්බන්ධයෙන් විවිධ අවස්ථාවලදී මහ සභාව මගින් චෝදනා එල්ලවූවත් මෙතෙක් ඇය පරිහරණය කල වාහනය සම්බන්ධයෙන් සභාපතිවරිය විසින් ගත් තීරණයක් නොමැති බව පෙනී යයි. අධික වියදමක් දරා දිනකට ගමන්වාර 04 ක් යොදවා ඇයගේ නිවසට ගමන් කිරීම පොදු මුදල් අවභාවිතයක් ලෙස පෙන්වා දෙමි. එබැවින් ඒ පිළිබඳවද මෙම විවාදයේදී කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.

3. 2022.10.11 වන දින ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පත පරාජයට පත්වීමෙන් පසු ලේකම්වරිය විසින් මන්ත්‍රීවරුන් වෙත එවන ලද ලිපිය අනුව කරුණු සඳහන්ව තිබුණේ අයවැය

කෙටුම්පතට විරුද්ධවීමට හේතු දින 07 කට පෙර ඇයට සහ කොමසාරිස්වරියට පිටපත් සහිතව එවන ලෙසය. නමුත් 2020 ඔක්තෝම්බර් මස 28 දින ආණ්ඩුකාරවරයා විසින් සකස් කරන ලද රීති සංග්‍රහයේ 11(1) අනුව සඳහන්ව ඇත්තේ වැඩකරන දින 03 කට පෙර ඉහත ආකාරයෙන් එවන ලෙසය. ඒ අනුව ප්‍රාදේශිය සභා මහජන නියෝජිතයින් නොමග යවා නීතිවලට පටහැනිව අයවැය කෙටුම්පත් සකස් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ලේකම්වරිය සම්බන්ධයෙන් මෙම විවාදයේදී කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි පළවෙනි කාරණය පිළිබඳව මුලින්ම කතා කරල ඉමු. යසිත් මන්ත්‍රීතුමා මැයි මස 11 වෙනිදා ලිපියක් මගින් මේ කාරණාව පිළිබඳ ඉල්ලීමක් කරල තිබුණා. මොකද අපි හැම සභාවකම වගේ සඳහන් කරපු දෙයක් මේක නීතියට ගියාම නීති විරෝධී ක්‍රියාවක් බව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ප්‍රකාශ කරල තිබෙනවා එදා අරලියගහ මන්දිරයේ පැවති රැස්වීම. අපි අහන්නේ මේ රැස්වීම සඳහා මොකක් හරි ලිඛිත දැනුම් දීමක් කරල තිබෙනවාද?. මම හිතන්නේ සභා පනතේ රීතියක් හැටියට අපි දන්නෙ මොකක් හරි රජයේ උත්සවයකට එන්න කියනවා නම් ලිඛිතව දැනුම් දෙන්න ඕනෑ. කෝල් එකක් දුන්නට ඒක කිසිම කෙනෙක් පිළිගන්නේ නැහැ. සභාපතිතුමිය කියනවා අගමැති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කැඳවීමක් කරාලු. මේක රහසක් නෙවෙයි. මේ කැඳවීම කලේ ගෝල්ෆේස් පිට්ටනිය හිටපු අයට පහර දෙන්න. මේවා ඒ ඇමතිලා ගත්ත මෝඩ තීරණ. ගෝල්ෆේස් එකේ හිටපු අයට ගහලා පන්නන කොට මේ ප්‍රශ්නය ඔක්කෝම ඉවරයි. ඊට පස්සේ මේ රට කරන්න පුළුවන් කියලා මේ අය හිතාගෙන හිටියේ. මේක විශාල ප්‍රශ්නයක් නම් මේ රටේ මැති ඇමතිලාගේ ගෙවල් විශාල ප්‍රමාණයක් විනාශ කරලා තමයි මේක නතර වුණේ. ඒ තත්ත්වයට මේ රට අරන් ගියේ කවුද? අරගල කරුවන්ට ඇඟිල්ල දික් කරනවා රට මේ තත්වයට පත් කළේය ඔවුන් කියලා. ඒ තත්ත්වයට පත් කරන්න මුල් වුණේ කවුද? රටේ ජනතාවට රහසක් නොවෙයි කවුද මේවා කළේ කියන එක. මෙහෙම රැස්වීමකට ගිහිල්ලා මේ සභාව සතු වාහනය තමයි විනාශ කළේ. නාරම්මල සභාපතිතුමා, පොල්ගහවෙල සභාපතිතුමා එදා ගියා. නමුත් ඒ අය කලින් ආවා අපේ මහජනතාවට සේවය කරන්න තිබෙන සභාව සතු වටිනාම සම්පත විනාශ කලා. මේ සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගන්නවා. ආණ්ඩුකාරතුමාට මේ ගැන දැනුම් දීලා තිබෙනවා කාරණා දෙකක් සම්බන්ධව. මේ සභාව අද විසුරුවයි අපට ප්‍රශ්නයක් නෑ.මැතිවරණ කොමසාරිස්වරයා කියලා තිබෙනවා මේ සීමානිර්ණ ප්‍රශ්නය, සහික ප්‍රශ්නය විසඳන්න අවුරුද්දක කාලයක් ඕනෑ කියලා. මම කියන්නේ මේ නීති විරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තීන්දුවකට ආ යුතු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ කැබ් රථය බේරේ වැවේ ගිල්වලා දැනට මාස ගණනාවක් වෙනවා. නමුත් මම හිතන්නේ සභාවේ විටින් විට ඒ ගැන ප්‍රශ්න කළා. විටින් විට විමසුවා. දැන් ඒ පිළිබඳ තත්ත්වය කුමක්ද? ඉදිරි කටයුතු කරන්නේ කොහොමද? පිළිබඳව. ඒ අරගලයේ දවසේ අරලියගහ මන්දිරයෙන් නිල කැඳවීමක් කළා කියලා මේ සභාවට පිළිගන්න පුළුවන් දෙයක් නෙවෙයි. මොකද ඒකට ආරාධනාවක් කරනවා නම් අගමැතිතුමාට ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ඒ ආරාධනාව කරන්න ඕනෑ. එතුමා ප්‍රසිද්ධියේම මාධ්‍ය වෙතත් අධිකරණයටත් කියල තිබුණ මෙහෙම රැස්වීමකට මම ආරාධනා කළේ නෑ කියලා. එහෙම නිල ආරාධනාවක් නැති රැස්වීමකට ගිහිල්ලා ඒ කැබ් රථය අද වෙන විට විනාශ වෙන්න ඇරලා තිබෙනවා. මේ සභාවේ ඒ ගැන පරීක්ෂණයක් වත් ඉහළින් මෙය ගැන පරීක්ෂණයක් වත් අද වෙනකම් අපි සභාවක් විදියට දැනුවත් වෙලා නෑ. අපි රක්ෂණයකින් ඒක ප්‍රතිපූර්ණය කර ගන්නවා නම් ඒක කරන්න පුළුවන් කොපමණක්ද? සභාවේ අරමුදල් දාලා හදනවා නම් ඒ කොච්චරක්ද ඒක ගෙනියන්න වැරදි කරපු අයට දෙන දඬුවම මොකක්ද කියන එක පිළිබඳව මේ සභාව දැනුවත් වෙලා නෑ. මේ කාරණා නිරවුල් කරගන්න තමයි අද මේ සභාවට මේ යෝජනාව දැම්මේ. ඒ නිසා මේ කාරණාව පිළිබඳ අපට නිරවුල් තාවයක් මේ සභාවෙන් දැනුවත් කිරීමක් අපි

බලාපොරොත්තු වෙනවා මොකක්ද මේකේ වර්තමාන තත්ත්වය කියලා. මෙය අනීතික වෙච්ච දෙයක්. මේ අනීතික ව කරපු දෙයක් නම් අනිවාර්යයෙන්ම විනය පරීක්ෂණයක් තියන්න ඕනෑ. එහෙම විනය පරීක්ෂණයක් දැනට කෙරීගෙන යනවා ද? එහෙම නැත්නම් ඒක නීත්‍යානුකූලයි කියලා කියනවා නම් මේක හදන්න සභාවෙන් අරමුදල් දෙනවාද? රක්ෂණ වන්දියෙන් සම්පූර්ණ මුදල ප්‍රතිපූර්ණය කරනවද? මේ දේවල් පිළිබඳව සභාව දැනුවත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාව සතු දේපලක්, රජය සතු දේපලක් අවභාවිතා වීම සම්බන්ධව අප කණ්ඩායම විසින් විවාදයක් ඉල්ලා සිටියා. අද දින ඒ සඳහා ලබා දීම ගැන ඔබටතුමියට ස්තුතිවන්ත වෙන්න ඕන. මේ කැබ් රථය පිළිබඳ පැහැදිලි විස්තරයක් මේ සභාවට මේ දක්වා ඉදිරිපත් වුණේ නෑ. ඒ නිසා තමයි මේ විවාදයක් අපට ඉල්ලන්න සිදුවුණේ. මේකේ ඇත්ත අපි දැනගන්න ඕන. මොකද සභාව සතු මහජන දේපලක්, මහජන බදු මුදල් යැපෙන ආයතනයක්. ඒ ආයතනයේ තිබෙන මහජන දේපලක් අවභාවිතා වීම පිළිබඳ අපි සියලු දෙනාගේ වගකීමක් තිබෙනවා ඒ පිළිබඳව දැනුවත් කරන්න. දැනුවත් වෙන්න. ඒ වගේම ජනතාව දැනුවත් කරන්න. මහජනතාවට සේවය කරන ආයතනයක් විදිහට මහජන නියෝජිතයින් විදිහට ඔවුන්ට සපයලා තිබෙන පහසුකම් සියල්ල ඒ මහජනතාව වෙනුවෙන් නැතුව පෞද්ගලිකව හෝ කිසියම් දේශපාලනයකට අවභාවිතා වෙනවා නම් ඒක වැරැද්දක්. ඒකට ඕන අධිකරණයක තීන්දුවක් දෙනවා. ආයතනයක ප්‍රධානියෙකුට සියලු පහසුකම් සපයලා තිබෙනවා මේ ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ. මේ මහජන සේවය සැලසීම සඳහා නිල වාහනයක් දීලා තිබෙනවා. නිල නිවසක් දෙනවා. ඒ වගේම කම්කරුවෝ සියලු දෙනා දෙනවා. වාහනයට ඉන්ධන ටික දෙනවා. ගමන් වියදම් දෙනවා. මේ සියල්ල දෙනවා. මේවා ලබලා දෙන්නේ මහජන සේවය සඳහා. තමන් මොනවා හරි දේශපාලන ක්‍රියාදාමයකින් බලයට එනවා නම් එම ආයතනයට නීත්‍යානුකූලව හෝ නීති විරෝධීව හෝ හොරෙන් හෝ ඇවිල්ලා ඒ ආයතනයේ ප්‍රධානියා වශයෙන් ඉඳලා කටයුතු කරන කොට ඒ දේශපාලන හස්තයේ බලපෑම මත බලය මත තමන්ට හිතුමතේ තමන්ගේ බලය පාවිච්චි කරමින් ඒ වගේ දේශපාල වුවමනාකම් ඉෂ්ට කරගන්න ඒ වගේ රාජ්‍ය දේපල භාවිතා කරන්න බෑ කියන එකයි අපේ අදහස. මේක හැම දේශපාලන පක්ෂයක්ම කරන වැරැද්දක්. මේක නැවතිය යුතුයි. ඒකෙ ප්‍රතිඵලය තමයි මෙපමණ වටිනා මහජන දේපලක් විනාශයට පත් වීම. මේක විශේෂයෙන්ම මහජන නියෝජිතයින් විදිහට අපි කතා කරන්න ඕනෑ. ඒක අපේ යුතුකමක්. ගම් මට්ටමින් අපි මේවට උත්තර දෙන්න අවශ්‍යයි. මේ පිළිබඳ පැහැදිලි විසඳුමක් අපිට දෙන්න. රක්ෂණයෙන් කොපමණ මුදලක් ගෙවනවද, දැන් මේ වාහනය හදනවද ,හදලා ඉවර ද, කොපමණ මුදලක් යනවද,මේ ආයතනයෙන් තව කොපමණ මුදලක් දාන්න අවශ්‍යයි ද, මේවා කියන්නෑ. මේක අධිහාරයට අහුවුනොත් මන්ත්‍රීතුමන්ලා හැමෝටම බලපානවා. දැන් අගමැතිතුමා කියන ප්‍රකාශයයි, සභාපතිතුමිය කියන ප්‍රකාශයයි, පරස්පර විරෝධීයි. අපි මේකේ ඇත්ත දකින්න ඕනෑ. එක එක බලහස්තයන්ට මේක යට ගහන්න දෙන්න බෑ. මේ රාජ්‍ය දේපළ, මහජන දේපල, මේක අපි රැකගන්න ඕනෑ. යම් සිද්ධියක් වුනා නම් මේකෙ වගකීම ගන්න ඕනෑ. වගකීමෙන් බැහැර වෙන්න බැහැ. රජයේ දෙයක් අයුතු විදිහට පරිහරණය කරලා විනාශ වුණා නම් ඒකට උපරිම දඬුවම විඳින්න ඕනෑ. රටේ නීතිය ඒකයි. රජයේ දෙයක් විනාශ වෙනවා නම් මහා භාණ්ඩාගාරයේ දෙයක් විනාශ වෙනවා නම් ඒකෙ වගකීම ගන්න ඕනෑ. ඒකෙන් නිදහස් වෙන්න නම් සත්‍ය කරුණු ඉදිරිපත් කළ යුතුයි. මේ විවාදය අපි ඒකපාර්ශවීය විය යුතු නැහැ. මේක අපි බලන්න ඕනෑ පොදු කෝණයකින්. හැම පක්ෂයකම බහුතරය අපිත් එක්ක ඉන්නවා. ඒ නිසාම ඒ පිළිබඳ සත්‍ය කරුණු පැහැදිලිව ඉදිරිපත් කරන්න අවශ්‍යයි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂ සභාවක් සඳහා මන්ත්‍රීවරු පහළොස් දෙනෙක් අත්සන් කරල ලිපියක් දුන්නා. ඒ අනුව, අද ඒ සඳහා අවස්ථාව ලබා දීම වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. අපි බෞද්ධයෝ විදියට තමයි මේ සභාවේ ඉන්නේ. අපි මේ සභාවට ආවේ වීපී ලාම්පුවේ ඉඳලා

මොකක් හරි වැඩක් මේ ප්‍රදේශයේ ජනතාවට කරන්න. අපට කරන්න පුළුවන් මේ ගමේ තොටේ තියන අහිංසක මිනිහගේ ඇල වේල්ල, එහෙම නැත්නම් පාරට බොරළු ටිකක් හරි දාලා ඔය වගේ පොඩි වැඩ කොටසක් තමයි මේ න්‍යාය පත්‍රයේ තිබෙන්නේ. පළාත් පාලන පනත අනුව තිබෙන්නේ. දැන් අපට ඒ ටිකවත් කරගන්න බැරි තත්වයක් තිබෙන්නේ. ඒ රටේ තිබෙන තත්ත්වය කියමුකො. ඒත් අපිට මුල ඉඳලම මේ වැඩ කරගන්න බැරි වුණා. අපේ සන්ධ්‍යා සභාපතිතුමා හිටියා. මෙතුමිය ඉන්නවා. අනාගතයේ කවුරු එනවද. අපි දන්නේ නෑ. එතකොට මේ අය මේ ක්‍රමවේදයේ හිටියේ නෑ. ඒ නිසා තමයි මේ දේ සිදුවෙලා තිබෙන්නේ. හැම කෙනාටම පංගුපේරුවට බැලුවා. සන්ධ්‍යා සභාපතිතුමා මිය ගියත් මම කනගාටු වෙනවා එතුමාගේ මිය යාම සම්බන්ධව. එතුමා එක එක්කෙනා අරබයා තමයි වැඩ කළේ. අවසානේ අපි පහළොස් දෙනෙක් එතුමාට විරුද්ධ වුණා. එතුමාට විරුද්ධව අපි පක්ෂ මූලස්ථානයට ලිපිගොනුව යොමු කලා. කුරුණෑගල දිස්ත්‍රික් නායකතුමාට ලිපිගොනුවක් යොමු කලා. එහෙත් එතුමාට විරුද්ධව ක්‍රියාත්මක වුණේ නෑ. අපි එතුමාටත් කිව්වා කාටත් වැඩක් කරන්න පුළුවන් හැටියට කටයුතු කරන්න කියලා. මම වැඩ බලන කාලේ විපක්ෂ නායකතුමා කිව්වා නගරයේ වැඩ පටන් ගන්නෑ කියලා. මේ සභාව දවසක මම ලේකම්තුමාට කිව්වා අධ්‍යක්ෂකතුමාට කතා කරලා දිනයක් ගන්න කියලා. එවෙලෙම මෙතුමිය කතා කරලා දිනයක් ගත්තා. ඒ දිනය ගත්තට පස්සේ තමයි ශාන්ත බණ්ඩාර මන්ත්‍රිතුමායි, සුමිත් රාජපක්ෂ මන්ත්‍රීතුමායි ගෙන්නලා එතුමලාගෙන් දිනයක් අරගෙන මාර්ග සංවර්ධන අධිකාරියේ ඒකනායක මහත්තයා ගෙන්වලා මේ මුළු බල ප්‍රදේශයේම මිනිස්සු මෙතනට ගෙන්වලා වෙළඳ සංගම්, පොල සංගම් ගෙන්වලා සාකච්ඡා කරලා ඒ ටික කරන්න පටන් ගත්තේ. ඒ වැඩේ කෙරුවෙ නැත්නම් තවත් ඕක ඇදගෙන යනවා. ඒ දවස් වල මම කැබ් එකේ ගියා. ඒ යන එන ගමන් කාගෙන්වත් මම කිසිම දෙයක් ගත්තේ නෑ. එවැනි සභාපතිවරු බිහි විය යුතුයි මේ රටේ. දේශපාලන නායකයෙක් පස් පව්වලින් වැළැකී සිටීමේ ක්‍රමයක් හදා ගන්නවා නම් ඔහු වැනසෙන්නෙ නෑ.

ගරු සභාපතිතුමියනි, පද්මා කියන නමට අපි විරුද්ධ නෑ. හැබැයි සභාපති කියන හේතුවෙන් අපට යමක් කියන්න සිද්ධ වෙනවා. NW PF - 7468 දරණ කැබ් රථය මැයි මාසයේ 09 වැනිදා බේරේ වැවට දැමීම සම්බන්ධවයි අපි මේ විවාදයක් ඉල්ලා සිටියේ. එදාම මේ සම්බන්ධව " මෙහෙම සිදුවීමක් වුණා මට සමාව දෙන්න" කියලා එදා මේ ගැන කිව්වා නම් අපි මන්ත්‍රීවරු 28 දෙනා සමඟම සාකච්ඡා කරලා කැබ් රථය හදාගන්න අවශ්‍ය කටයුතු සිදු කළා නම් ප්‍රශ්නයක් නැහැ. ඔබතුමිය මේවා වසන් කළා. ඔබතුමියට තිබුනේ ලේකම්තුමියට කියලා මේක සභාවට දාන්න. අපි යෝජනාවක් කෙරුවා. එදා කිව්වා න්‍යාය පත්‍රයට දාන්න ඕනෑ කියලා. ඊට පසු යසිත් මන්ත්‍රීතුමා අපි එකතුවෙලා යෝජනාවක් දුන්නා ඒකත් න්‍යාය පත්‍රයට දැම්මෙ නෑ. අපි කියන්නේ මේ ක්‍රමය වැරදියි කියලා. දැන් ඔබතුමිය කියනවා ඔබතුමියට දුරකතන ඇමතුමක් දුන්නා කියල. මේක ඔබතුමිය පළාත් පාලන ආයතනයේ රාජකාරි කටයුතුවලට, පළාත් පාලන දෙපාර්තමේන්තුවට, පළාත් පාලන ඇමතිතුමා හමුවෙන්න ගිය ගමනක් නොවෙයි. අගමැතිතුමා හමුවෙන්න ගිය ගමනක්. මමත් ඒ කාලේ ගියා. නමුත් ඒ කාලයේ මේ ප්‍රශ්න තිබුණේ නැහැ. මේ ප්‍රශ්නය ඇදුනෙ ගෝල්ෆේස් අරගලයේ අරගලකරුවන්ට ගහන්න ගිය අවස්ථාවේ. ඒක බාර දෙන්න ඕනෑ පොලිසියට, හමුදාවට. ජනාධිපතිතුමා නියෝගයක් දුන්නා නම් මුලින්ම ඔය අරගලයේ පටන් ගන්නේ නෑ. අවි බලයෙන් මේවා නවත්වන්න බෑ. ඔබතුමිය ඔබතුමියගේ නිදහසට කරුණු හැටියට කියනවා දුරකථනයට අරලියගහ මන්දිරයෙන් ඇමතුමක් ලැබුණා කියලා. නිල ප්‍රකාශයක් නම් අගමැතිතුමාගේ ලේකම් කෙනෙක් හරි කියන්න ඕනෑ. ඔබතුමියගේ පිළිතුරු කතාවේ තියෙන්නේ එහෙම. මම ඒක කියවන්නම්.

**මේ ලිපියේ සඳහන් කරුණු පිළිබඳ මගේ බලවත් කණගාටුව පල කරමි.**

ඔබතුමිය කණගාටුව පළ කරන්නේ ලිපියට. වාහනය කැඩුනු එකට නොවෙයි. අපි එතකොට මේ වැරදි වැඩක් කරන්නේ.

**ඊළඟට මැයි 9 වන දින සාමකාමී අරගලයට පහර දීමට මා සමග පිරිසක් සහභාගී වූ බවට එහි සඳහන් කර තිබීම සම්පූර්ණයෙන්ම අසත්‍ය කාරණයක් වෙනවා.**

ඔබතුමිය තනියම රියදුරාත් එක්ක ගියා නම් හරි. නමුත් මේ ෂෙල්ටන් මන්ත්‍රීතුමා කියනවා එතුමා ඒ වාහනේ ගියා කියලා. එතුමට ලේකම් කෙනෙක් දුරකථන ඇමතුමක් දුන්නලු. එහෙනම් මේකේ උප සභාපති කෙනෙක් නැද්ද, වෙන මන්ත්‍රීවරු 15 දෙනෙක් හිටියේ නැද්ද. අගමැතිතුමා අපටත් ආරාධනා කෙරුවද, නෑ. ඔබතුමියට යන්න කිව්වම එහෙනම් මේ අය යන්නේ මොකටද. ෂෙල්ටන් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේ මෙහෙම තිබෙනවා.

**ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මාව ආරක්ෂා කිරීමට කටයුතු කළා. ඒ පිළිබඳ මා ස්තුතිවන්ත වෙනවා. මා හට සම්බන්ධීකරණ ලේකම්තුමාගෙන් අරලියගහ මන්දිරයේ එම අවස්ථාවට සහභාගී වන ලෙසට ඇමතුමක් ලැබුණා. සභාපතිතුමිය යන නිසා මාත් එම වාහනයේම ගියා.**

එහෙමනම් සභාපතිතුමියට වැඩිය එතුමාට සම්බන්ධීකරණ ලේකම් කෝල් එකක් දීලා තිබෙනවා. සභාපතිතුමිය කියනවා එතුමයි රියැදුරු මහත්තයයි විතරයි ගියේ කියලා. එතකොට මෙතුමා කියනවා මෙතුමාත් ඒ වාහනයේ ගියා කියලා. එහෙම නම් මේවා පරස්පර විරෝධී නැද්ද .ඒ වගේ ඒවා අපි කතා නොකර ඉන්න ඕනැද. ඔබතුමියට දුකක් කරදරයක් උනා නම් ඒත් අපි කණගාටු වෙනවා. සන්ධ්‍යා සභාපතිතුමා නැතිවුණ අවස්ථාවේ අප කනගාටු වුණේ නැද්ද. එතුමා වෙනුවෙන් ඒ කළ යුතු දේවල් සියල්ල අපි කළා. මේ වාහනය සම්බන්ධව කතා කරන විට පොල්ගහවෙල, නාරම්මල සභාපතිවරුත් එදා අරලියගහ මන්දිරයට ගියා. ඔබතුමියටත් ඒ සමඟ කතා කරලා ඒ අයත් එක්කම එන්න තිබුණා. දැන් වෙලා තිබෙන්නේ මහජන දේපලක් හැටියට තිබුණ මේ කැබ් රථය, සභාවේ වටිනාම දේපල, එකෙන් මමත් ගියා. ඒ වාහනයේ ඔබතුමියත් ගියා. ඒකේ ප්‍රශ්නෙකුත් නැහැ. එතැන මේ සිද්ධිය වෙනකොට ඔබතුමියට තිබුණේ කාන්තාවක් විදියට එතනින් මග ඇරලා එන්න. එතන හිටපු සමහර ඇමතිවරු මේක කුලප්පු කළා. ඊට පස්සේ දෙබර කූඩෙට ගල් ගැහුවා වගේ මේක ඇවිස්සුනා. ඊට පස්සේ අගමැතිතුමා කියනවා, නීතිපතිත් කියනවා මේක නීති විරෝධී රැස්වීමක් කියලා. අගමැතිතුමා කියනවා එතුමා ආරාධනා කළේ නෑ, මම බැහැදකින්නයි ඇවිදින් තිබෙන්නේ ඒ අය කැමැත්තෙන්. එතකොට ඔබතුමිය කියනවා ආරාධනා කරපු නිසයි ගියේ කියලා. අපි කොපමණ කතා කලත් මේකට විසඳුමක් මෙතනින් ලැබෙන්නේ නෑ. නමුත් කවදාහරි දවසක අපි මේ ගැන කතා කලා කියලා හරි තිබෙන්න ඕනෑ.ඒ නිසයි අපි කතා කලේ.දැන් මේ වන විට කැබ් රථය හදමින් යනවා කියනවා. හැදුවා කියනවා. හෙට අනිද්දා ගේනවා කියනවා. කොච්චර මුදලක් ගියාද,ඒ මුදලේ රක්ෂණයෙන් කොපමණ ගෙව්වද, ඉතුරු මුදල් කවුද ගෙවන්නේ. අපි දැන් කියලා තිබෙනවා සභා අරමුදලින් ගෙවන්න එපා කියලා. ඒක අධිභාරයට යන නිසයි අපි එපා කියලා තිබෙන්නේ. මේ මුදල හිතවතෙක් ගෙවනවද, අපේ ඉඩකඩම් විකුණලා ගෙවනවා ද. එහෙම නැත්නම් රජයෙන් ගෙවනවද. නීතියෙන් මොකක් හරි තීන්දුවක් මේකට දෙනවද නැද්ද ඒකයි අපි අහන්නේ ඒ පියවර මොනවද කියලා. ඉංජිනේරුතුමා කියලා තිබෙනවා මේ වාහනය කඩිනම්ව හදන්න කියලා. මොකද බේරේ වැවට වැටුන වාහනයක් මලකඩ කන්න තියෙන ඉඩ ප්‍රමාණය වැඩියි. මේ සභාව විසුරුවන්න පෙර මේකට විසඳුමක් තිබිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාව අලව්ව ලෙසට වෙන් වෙලා සන්ධ්‍යා සභාපතිතුමා සිටින කාලයේ වාහන අවභාවිතා වෙලා කියලා මේ සභාවේ ප්‍රසිද්ධියේ කතා කළා. එතකොට හිටිය ලේකම්වරියගෙනුත් ප්‍රශ්න කළා. මේ සභාවේ වැඩ කරන සේවක මහත්වරුන් කැන්වසින් යනකොට සන්ධ්‍යා සභාපතිතුමාගෙන් අහපුවා හැන්සාඩ් එකේ ඇති. මේ අරන් යන කණ්ඩායම සම්බන්ධයෙන් අවභාවිතයට යම් කිසි ප්‍රශ්නයක් වුනොත් කොමසාරිස්තුමා හරහා විනය ක්‍රියාමාර්ගයට ආවොත් ඔබ ඔවුන්ගේ රැකියාව සුරක්ෂිත කරනවාද. අපි එදා ඉඳලම මේ සභාවේ

දැක්ක දෙයක් තිබුනා මේ අවභාවිතාව අවසන් විය යුතුයි කියලා.ඒ නිසා මේ අවභාවිතාව සම්බන්ධයෙන්, මේ රාජ්‍ය දේපල සම්බන්ධයෙන් ගෙනා මේයෝජනාවතමුන්නාන්සේලා සියලු දෙනාම මෙතෙක් වෙච්චි සියලු අවභාවිතාවන් ගැන සලකා බලා ගෙනා හොඳ යෝජනාවක් ලෙසට තමා මම සලකන්නේ. මට මේකෙදි මතක් වෙනවා එක ජනාධිපතිවරණයක් වෙනකොට ගාමිණී ගුණදාස සභාපතිතුමාටඅපි කීවා රැස්වීමකට එන්න කියලා. එතුමා කීවා සභාවේ කැබ් එකේ ආවොත් ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. මට වෙන වාහනයක් ගෙදර තියෙනවා. ඒ වාහනෙ මම එන්නම්. මම මේක පාවිච්චි කරන එක යුතු නෑ. මාත් කලින් මේ මෝඩකම සැරයක් කලා. ආයේ ඒක කරන්නෙ නෑ. ඒ ගැන කතා කරන්න එපා කීවා. ඒ වගේම ගරු උප සභාපතිතුමා සාක්ෂි දරයි අපි නාරම්මල සභාවට ගිහිල්ලා පළමුවෙන්ම අපට තිබුණ ප්‍රශ්නේ තමයි එදා සභාවේ තිබුණ ඩබල් කැබ් රථය අනතුරකට පත්වීම සම්බන්ධව සභාවේ කතා කරන්න. එදා ගාමිණී ගුණදාස සභාපති වරයා පැරදිලා ගෙදර ගියා. සභාවේ කැබ් රථය කොළඹ ඉඳලා නැවත පැමිණෙන විට කඩවත ප්‍රදේශයේදී අනතුරකට ලක් වුනා. මම හිටපු විපක්ෂ නායක හැටියට යූඑන්පී කාරයෙක් අතින් වෙච්චි මේ අනතුර කියලා අත්හරින්න තිබුණා. වර්ණසූරිය මන්ත්‍රිතුමාට මතක ඇති මෙතුමා මගෙන් ඇහුවා සභාවේ ඉවර වුන වෙලේ මොකටද තමන්ගේ පක්ෂයේ කෙනෙකුට විරුද්ධව ලෙඩ අදින්නේ කියලා.ලෙඩ ඇදීමක් නොවේ, සභාවේ සභාපතිවරයා හැටියට කැබ් රථය ගෙනිහිල්ලා ගුණදාස මැතිතුමා අතින් නම් මේ විනාශය වුණේ ඒක මේ සභාවේ අහන්න තමයි ජනතාව අපි සභාවට එවල තියෙන්නෙ. ඒකට වර්තමාන සභාපතිතුමා උත්තර දෙයි. කොමසාරිස්තුමා ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගනියි. ඔබට මතක ඇති මම ඒක ඇහුවා. එදා එහෙම ඇහුවට පස්සෙ එවකට හිටපු සභාපති සුමිත් කුමාර රාජපක්ෂ මැතිතුමා කිව්වා, මේක හොඳ දෙයක්, ඔබතුමා අහපු එක. මේ සම්බන්ධව තීරණයක් ගැනීමට කොමසාරිස්තුමාගෙන් ඉල්ලීමක් කරනවා. මට යන්න පුළුවන් එතැනට විතරයි. කොමසාරිස්තුමා අපිට කොච්චර මේ පණතේ බලය තියෙනවා කිව්වත් අපට උඩින් කොමසාරිස්තුමා ඉන්නවා. කොමසාරිස්ට උඩින් ආණ්ඩුකාරතුමාඉන්නවා. ඒ නිසා මට කොමසාරිස් ළඟට යන්න වෙනවා.කුරුණෑගලදී අතුල මහත්මයා මා හමුවුණාම මම එතුමාගෙන් ඇහුවා අපි දැන් මේ ප්‍රශ්නයට මොකක්ද ගන්න ක්‍රියාමාර්ගය කියලා. හොඳ ප්‍රශ්නයක් අහල තිබුනෙ, ඕක එවන්න කියන්න සභාවෙන් කුරුණෑගලට. ඕක සභාවෙන් කුරුණෑගලට එව්වම කොමසාරිස්තුමා අවසානයට ඕක දාන්නෙ මට උපදෙස් පතන්න. මම කිසිම වෙලාවක සභාවෙන් මුදලක් ගෙවන්න ඉඩ තියන්නේ නැහැ. රක්ෂණයක් කරලා වාහනයක් ගත්තා නම් අනතුරක් වුනාමරක්ෂණයෙන් හදන්න ඕනෑ. ඊට පරිබාහිරව කීයක් හරි ගියොත් ගාමිණී ගුණදාස මහත්තයාට අධිභාරයකට ලක් කරලා හරි ගෙවන්න කියලා මම නියෝග කරනවා. මේක හොඳයි ගෙනාව එක. මේක නොකලානම් වෙන්නේ මේක පූර්වාදර්ශයක් කරගෙන තමුන්නාන්සේලා අතරත් මේක දෝලනය වෙවී යනවා. හැන්සාඩ් එකේ ඇති එදා අපි කරපු කතාව. උප සභාපතිවරයා හිටියා, සුගතපාල මන්ත්‍රිතුමා හිටියා, වර්ණසූරිය මන්ත්‍රිතුමා හිටියා, ජයතිලක මන්ත්‍රිතුමා හිටියා. මම හිතන්නේ ඒකේ අවසානය වුනේ ඒ කැබ් රථය මේ වන විට සභාවේ තියෙනවා. ඒ කැබ් රථය රක්ෂණ සමාගමෙන් අලුත්වැඩියා කරන්න යවලා, අලුත්වැඩියා කරලා ආවට පස්සෙ රක්ෂණයෙන් සභාවේ මුදල් ප්‍රතිපත්ති කාරක සභාවට දාල තිබුනාසභාවෙන් කිසිම ප්‍රතිපූර්ණයක් නොමැතිව රක්ෂණයෙන් අවසන් කරන්න ඕනේ කියලා. අලව්ව නගරය කේන්ද්‍ර කරගන්න බහුතරයක් කට්ටිය කරපු ඉල්ලීම තමා මේ පිළිබඳව සභාවෙන් ප්‍රශ්න කරන්න කියලා. ප්‍රශ්න කරලා මෙතැනින් මේක නවත්තගන්න උත්සාහ කලොත් ඉදිරියටත් සභාවේ මුදල් පරිහරණය කරන්න කට්ටිය බය වෙනවා. නමුත් සන්ධ්‍යා සභාපතිතුමා කීවා කරන්න දෙයක් නැතිකමට මම සේවකයෝ ගෙනිච්චා. සේවකයෝ ටික අරන් යන්නේ මෙතනින්. අපිට පේනවා. හැබැයි සේවක මහතුන්ගෙන් අහපුවාම මුකුත් කියන්නේ නෑ. බිම බලා ගන්නවා. මම සභාපති නම් සේවක මහතුන් 10 දෙනෙකුට ගමනක් ගිහින් එන්න කියලා කීවොත්, සභාපතිගේ අණට ඉහලින් යන්නෙ නෑ යනවා. මේකයි අපිට වුන වැරැද්ද. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවකට අපි එවන ජනතාව බලාපොරොත්තු වෙනවා පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, මොනවා සිද්ධ වුණත් අපේ හෘද සාක්ෂියට එකඟව අපි මේකේ වැඩ කරයි කියලා. ඒ නිසා දිගින් දිගටම අපේ

ප්‍රදේශය තුළ කාට හෝ අකටයුත්තක් වෙනවා නම් ඒක දේශපාලන වශයෙන් අවභාවිතා වෙනවානම් අපි ඒකට විරුද්ධව පෙනී සිටින්න ඕනෑ. ඒ නිසා ඔබතුමාලා ගෙනාවේ හොඳ යෝජනාවක්. 05 වන මාසයේ මේ කැබ් රථය ගෙනිහින් මේ කැබ් රථය බේරේ වැවට දාලා ගෙන පහර දීමකට ලක් වෙලා මෙතැනට ගෙනත් පෙන්නුවට පස්සේ අපි කතා කරලා ඇහුවේ දැන් මේ කැබ් රථය සම්බන්ධයෙන් ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. මම ඒක සභාපතිතුමියගෙන් ඇහුවේ නෑ. මම ඇහුවේ ලේකම්වරියගෙන්. මොකද අපි ඔක්කොම මහජන නියෝජිතයෝ. පරිපාලන නිලධාරීන් අවසානයේ බැඳිලා ඉන්නවා මේකට වගකියන්න. රක්ෂණ සංස්ථාවට කතා කරලා තියෙනවා. රක්ෂණ සංස්ථාව කටයුතු කරනවා. රක්ෂණ සංස්ථාව කටයුතු කරනවා නම් මේක රක්ෂණ සංස්ථාවෙන් ඉවර කරන්න ඕනේ. මම කීවා සභාවෙන් එක සත පහක් හරි වැය කරලා තිබුනොත් අපි විරුද්ධයි කියලා. හැබැයි මම තිත්ත ඇත්ත කතා කරලා තියෙනවා. ඒ නිසා ගරු උප සභාපතිතුමා නාරද මන්ත්‍රිතුමා, යසිත් මන්ත්‍රීතුමා ඇතුළු මේ කණ්ඩායම ගෞරවනීය විදිහට මෙම ඉල්ලීම කරලා තියෙන්නේ දැන් මේක හදලා ඉවරද, මහජන බදු මුදලින් මේකට කීයක් වියදම් කරලා තියෙනවද තියෙන ප්‍රශ්නේ දැනගන්න. ඔබතුමාලා හොඳ යෝජනාවක් ගෙනත් තියෙන්නේ. ඒ නිසා ඔබතුමාලාට මම ගෞරවය පුද කරනවා විශේෂයෙන්ම සභාවක් තුළ ගත් මේ උදාර තීන්දුව සම්බන්ධයෙන්. එදා එවකට ගාමිණී සභාපතිතුමා යටතේ ඩබල් කැබ් රථය දැඩි හානියකට පත්වෙලා මහ ඇමතිතුමා උත්තර දුන්න ආකාරය, ඊට පස්සේ මහ ඇමතිවරු හැසිරුනු ආකාරය, ආණ්ඩුකාරතුමා හැසිරුණු ආකාරය, කොමසාරිස්තුමා හැසිරුණු ආකාරය අපි දැක්කා. මේ සම්බන්ධව කටයුතු කරද්දී අපි විශ්වාස කරනවා මහජන නියෝජිතයින් හැටියට අපිට ප්‍රශ්න තියෙන්න පුළුවන්. අපව මෙතෙන්ට පත් කරපු ජනතාව එළියේ බලා ඉන්නවා අපි මේ ගත්ත තීන්දුව ගෞරවාන්විත ද නැද්ද කියලා. ඒ නිසා ඔබලා ගෙනාවේ ගෞරවාන්විත යෝජනාවක්. ඒ සම්බන්ධව කරුණු දැක්වීම මූලාසනයට තියෙනවා.මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මගේ ගෞරවය නැවතත් පුද කරනවා. අදින් පසුව අපි තව ඉන්නේ මාසයයි දෙකයි වෙන්න පුළුවන්. ඒ කාලය තුළ අපි මේ සභාවට ආවේ ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න කියමින් විශේෂයෙන් ඒ ජනතාව තේරුම් ගනියි කියලා මතක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කැබ් රථය විනාශ වීම සම්බන්ධව මාගේ විරෝධය තියෙනවා. එදා වුන අරගලය නිසා, අනවශ්‍ය ප්‍රශ්න නිසා අපේ සභාවේ කැබ් රථයත්, ලංකාවේ වෙනත් රාජ්‍ය ආයතනවල වාහනත්, පුද්ගලික අංශයේ වාහනත්, නිවාස විශාල ප්‍රමාණයකුත් විනාශ වුණා. ඒක අවාසනාවන්ත සිදුවීමක් මේ රටේ. පක්ෂ භේදයකින් තොරව දෙපැත්තටම වුන හානිය විශාල අපරාධයක්. කිසියම් පිරිසක් අරගල කරා. ඒක ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය. අපේ නායකයෙක්, කණ්ඩායමක් කරපු අනවශ්‍ය ක්‍රියාවක් නිසා රටම ගිනි ගත්තා. අපි බෞද්ධයෝ වශයෙන් මොන ආගමක හිටියත් එදා අරගලයේ අයට තිරිසන් විදිහට ගැහුවා. කාන්තාවන්ට ගැහුවා. ඒ වගේම ඒක ඉවර වෙලා පැය භාගයක් යන්න කලින් රට පුරාම අරගලයක් ඇති වුනා. එයාලත් දැවැන්ත හිංසනයකට ලක් වුනා. අරගලයට සම්බන්ධ නැති අහිංසක මිනිස්සුත් ගුටි කෑවා. ඒකත් අපි හෙළා දකිනවා. අසාධාරණ වැඩ කළාම මිනිස්සු ඒ එක්කම ගහන්න පටන් ගත්තා. බස් නැවැත්තුවා, නිවාස වලට ගැහුවා. කාගේ වුණත් විශාල අපරාධයක්. අපේ රටේ ධනය, රජයේ හෝ පුද්ගලික මුදල්. එය අනිවාර්යයෙන්මරටේ ආර්ථිකයට සෘජුව බලපානවා. ව්‍යාපාර ගිනිබත් කළා. ජාත්‍යන්තර වශයෙන් අපේ රටට විශාල අපකීර්තියක් ඇති වුනා. දේශපාලඥයන් විසින් ගත්ත මෝඩ තීරණ නිසා මහින්ද රාජපක්ෂ කියන මනුස්සයාගේ නමත් විනාශ වුණා. එතුමාටත් තිබුණේ මේ අනවශ්‍ය ප්‍රශ්නයේදී කලින් ඉවත් වෙලා යන්න. ගෝඨාභය ජනාධිපතිතුමා ඔයිට වඩා තීරණ ගත්තනම් මේ රටට මෙහෙම නරක තත්වයක් උදා වෙන්නේ නෑ.

අපි මහා පරිමාණ හොරකම් දැකලා තිබෙනවා. දැක්ක වෙලාවට අපි ඒ කටයුතුවලින් ඈත් වුණා. නැත්නම් අපිටත් වෙන්නේ අසරණ වෙන්න තමා. විශේෂයෙන්ම සභාපතිතුමිය වෙලාවට ෂෙල්ටන් මන්ත්‍රීතුමා එක්ක ගියේ. ඔබතුමිය වෙන මොලේ නැති කෙනෙක් බැරිවෙලා හරි ඔය

කැබ් එකේ දාගෙන ගියා නම් කැබ් එකත් කුඩු කරලා ඔබතුමිය මිය ගිහින් තමයි එන්න වෙන්නේ. මොනවා උනත් අපි කාටවත් හානි වෙනවට කැමති නැහැ. ඒවා අපි අනුමත කරන්නේ නෑ. අපිට වාහනය හදා ගන්න පුළුවන්. අහිංසක මන්ත්‍රී කෙනෙක් මිය ගියා. තව මිනිස්සු ගුටි කෑවා. අපි කවදාවත් ඒවා අනුමත කරන්නෙ නෑ. ඒ නිසා මම කියන්නේ මේ රට නරක තැනට ගෙනැල්ලා අනවශ්‍ය ප්‍රශ්නයක් තමයි මේ රටේ ඇතිකළේ. ඒකෙන් වුණ හානිය අපිට කියන්න බෑ.අපිටසංචාරක ව්‍යාපාරයෙන් එන්න තිබුණ විදේශ විනිමය අහිමි වුණා. මොකද සංචාරකයින් බයයි රණ්ඩු වෙන තැන් වලට එන්න. ඒ වගේ අපේ රටත් නරක තැනකට මේ දෙපාර්ශවය විසින්ම තල්ලු කලා.හැබැයි මූලික වැරැද්ද කළේ අපේ ආණ්ඩුවේ අය තමයි. ඒ අනවශ්‍ය වැඩක් කරලා. ඒ මිනිස්සුන්ට ගැහුවේ නැත්නම් ඕය ටිකඅවසන් කරලා සමහරවිට ගෙදර යන්න තිබ්බා.ඒවා කරලා අපේ රට ගොඩක් නරක තැනකට තල්ලු වුණා. විශේෂයෙන්ම අපේ සභාවට තියෙන ලොකුම වත්කම, ලොකුම සම්පත අපට අහිමි වුණා.ඔබතුමියට ඇත්තෙන්ම පක්ෂයෙන් ආරාධනාවක් තියෙන්න ඇති. ඒකෙන් විශාල අපරාධයක් වුණේ. ඇත්ත වශයෙන්ම මම කියන්නේ සභාපතිතුමියත්උප සභාපතිතුමත් සභාපති ධූර දරන කාලයේ මුදල් වංචා කළේ නෑ.අපි ඒක අවංකව පිළිගන්න ඕනෑ. හරි දේ හරි කියලා කියන්න ඕනෑ. නගර සංවර්ධනය උප සභාපතිතුමා ආරම්භ කළා. අපි ඒවා අගය කරනවා. මේ ප්‍රශ්නයට වුණත් මුල මේ රටේ නායකයෝ ගත්ත අදූරදර්ශී තීන්දු. ගෝඨාභය ජනාධිපතිතුමා හොඳ මනුස්සයෙක්.එතුමාට රට පාලනය කරගන්න බැරි උනාට පුද්ගලයා වශයෙන් නරක කෙනෙක් නෙවෙයි. ඇත්ත වශයෙන්ම අගය කරන්න ඕනෑ. මොන ප්‍රශ්න තිබුනත් මිනිස්සුන්ට වෙඩි තියන්න නියෝග දුන්නේ නෑ.ජීවිත හානි කලේ නෑ.නමුත් රට ආර්ථික වශයෙන් පරිහානියට ලක් වුනා. ඒ වගේම ඔබතුමියත් අනවශ්‍ය ප්‍රශ්න ගොඩකට මැදිවෙලා ඉන්නේ අනවශ්‍ය පුද්ගලයෝ ආශ්‍රය කරන නිසා. ජනාධිපතිතුමාටත් වුනේ ඒකයි.ඕනෑම නායකයෙක් ඉන්න ඕනෑ ප්‍රගතිශීලි මිනිස්සු කණ්ඩායමක් එක්ක.දෙයක් කරගන්න බැරි මිනිස්සු එක්ක හිටියම මුළු කණ්ඩායමම විනාශ වෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා යුද්ධය ඉවර කලා. අද එතුමාගේ ගෞරවය නැතිවෙලා.අද එතුමාට මිනිස්සු බනිනවා.මේ ප්‍රශ්නෙදි ඔබතුමිය එක්ක පෞද්ගලික තරහක් නෑ. නමුත් සභාවේ වාහනයට සිදුවුන හානිය පිළිබඳ විශාල කනගාටුවක් තිබෙනවා. ඔබතුමිය දැනගෙන යන්න නැතුව ඇති.නමුත් ඒක අපරාධයක්. විශාල පාඩුවක් වුණේ සභාවට. කණ්ඩායමක් විදියට මේවාට එකඟ වෙන්න බෑ. විශේෂයෙන් ඔබතුමිය මතක් කරන්න කැමතියි ඊයේ දිනයේදීත් සභාවේ ප්‍රශ්නයක් ඇති වුණා. ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා බහුතර කණ්ඩායම ගත්ත තීන්දුවත් එක්ක මේ 28 දෙනාම, අපි අනෙක් අය හවුල් කරගන්න එපා කියන්නේ නෑ. හරි තීන්දුවලට එන්න. නැත්නම් මේක ගෙනියන්න බෑ. අපි වෛර කර ගන්නවා විතරයි. මොකද රනිල් මහත්මයා යන ක්‍රමයත් එච්චර හොඳ මදි. ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. ආර්ථිකයේ හොඳ පැතිත් තියෙනවා. අපේ වාහනය ලක්ෂ 200 ක් විතර වටින වාහනයක්. එයට විශාල හානියක් වුණා. මගේ පුද්ගලික මතය අනුව මෙය වැරදි වැඩක්. ඒකට අපිට එකඟ වෙන්න බෑ කියලා ප්‍රකාශ කරමින් ඔබතුමියටත් මම කියන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට වුනා වගේ වැඩක් නැති මිනිස්සු ලං කරගන්න එපා. ඒකෙන් වෙන්නේ තමන්ටත්, සභාවටත් විශාල අගතියක්. ගමනක් යන්න හොඳ මිනිස්සු ලං කරගන්න කියලා ප්‍රකාශ කරමින් සියලු දෙනාටම සුභ අනාගතයක් පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනාවට අදාළ කාරණය ආරම්භ වන්නේ මැයි 09 වන දින සිදුවුණු සාමකාමී අරගලයට අනවශ්‍ය ලෙස පහර දීමට මැදිහත් වීමේ සිදුවීම මූලික කරගෙන. සාමාන්‍යයෙන් ඕනෑම රටක රටේ ජනතාව ජීවත් වන්න අමාරු වෙද්දි, දරුවන්ට කන්න දෙන්න අමාරු වෙද්දී, දරුවන්ව පාසල් යවන්න අමාරු වෙද්දී බෙහෙත් ටික නැති වෙද්දී, ඥාතීන් මියයද්දී, ජනතාව පාරට බහිනවා. ඒක සාමාන්‍ය දෙයක්. එතකොට පාලකයන් දැනගන්න ඕනෑ ඒක විඳ දරා ගන්න. ඒක සමනය කරන්න. මොකද ජනතා ඡන්දයෙන් පත්වන පාලකයෝ විදියට ජනතාවට හානියක් නොවන පරිදි මේ ප්‍රශ්න විසඳන්න පාලකයෝ දැනගන්න ඕනෑ. ඒකට තමා

ඔබ තමුන්නාන්සේලා එකතුවෙලා ඡන්දයෙන් පාලකයෝ පත් කරන්නේ. හැබැයි ඔවුන් එම බලය අරගෙන ජනතාවට ගහලා, තලලා පෙලලා ප්‍රශ්න විසඳන්න හදනවා නම් ඒකට ලැබෙන උත්තරය ජනතාවට දරාගන්න නොහැකියි. බොහෝ විට මම දැක්ක දේ තමයි ගෝල්ෆේස් ඒකෙ තමයි අරගලයේ තියෙන්නෙ කියලා. හැබැයි ඊට එහා අරගලය මිනිස්සුන්ගෙ හිත් ඇතුලේ තිබ්බා. මිනිස්සුන්ගෙ ඔලුව ඇතුලේ ජීවත් වීමේ අරගලය තිබුණා. එතකොට ඒ අරගලයට ගහලා ඒක පුපුරවා හරිද්දි ඒ පුපුරා ගියේ ජනතාවගේ හිතේ තිබ්බ අරගලය. ඉතිහාසයේ 80 ගණන් වල සිදු වූ සිදුවීම් ගොඩක් දේවල්වලට මෑත ඉතිහාසය උදාහරණ සපයනවා. පාලකයෝ දුර දැකලා කටයුතු කළේ නැත්නම් අනාගතයේදී මීට එහා දේවල් සිදු වෙනවා. අපි දුටුවා ඔබතුමියටත් පක්ෂ වලින් ආරාධනා කළාම යන්න වෙනවා. ඔතන කවුරු හිටියත් ඒක සාධාරණයි. හැබැයි එතනින් එහාට ගන්න ක්‍රියාමාර්ග විනිවිධ වෙන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවේ ඉන්නවා ඔබතුමියත් එක්ක මන්ත්‍රීවරුන් 28 දෙනෙක්. මේ 28 දෙනා එක්ක මේ සිදුවීම බෙදාගෙන, කතාබහ කරගෙන මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබ්බ අවස්ථා මග හැරුණා. සභාවේ කැබ් එක මිනිස්සු හෙව්වා. අපට ජනතාවට උත්තර දෙන්න සිද්ධ වුණා. මුලින්ම කැබ් එක කොහේද තියෙන්නෙ කියලා හොයා ගන්න අපට බැරි වුනා.ඒ එතැනට යන්නේ නැතුව මේ සිදුවීම වුන වෙලාවේ හරි විනිවිදභාවයකින්, මෙහෙම දේකට මට යන්න සිදු වුණා, මට මෙහෙම ප්‍රශ්ණ වලට මුහුණ දෙන්න වුණා, මෙන්න මේ වගේ තත්වයක් දැන් තියෙන්නේ, ඒක නිසා අපි එකතුවෙලා මේක විසඳාගමු කියන තැන හිටියා නම් මේ ප්‍රශ්නය මෙච්චර දුරදිග යන්නේ නැහැ. ඊට පස්සේ අපි කණ්ඩායම ඔබතුමියගෙන් මේ ගැන විමසා සිටියා. එදා නියපොත්තෙන් කඩන්න තිබුන දේ දැන් අද පොරොවෙන් කපන තැනට ඇවිල්ල තිබෙනවා. අපට ඡන්දය දුන් ජනතාව කැබ් රථය පිළිබඳ විමසනවා. මාත් දැනගත්තේ එහෙම කතා කරලා අහනකොට තමයි මෙහෙම ප්‍රශ්නෙකට මුහුණ දීල තියෙන්නෙ කියලා. අපේ පක්ෂ වල නායකයෝ අපෙන් විමසනවා මෙහෙම තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා ඔයාල කණ්ඩායමක් විදියට ගන්න ක්‍රියාමාර්ග මොනවද කියලා. අපි මේවට උත්තර දෙන්න ඕනෑ. මේ ප්‍රාදේශීය සභාවේ අපි ගන්න හැම රුපියලක්ම අපි ගෙදරින් ගෙනාපුවා නෙවෙයි. මේවා ජනතාවගේ බදු මුදලින් නියම් හෝ අනියම් මාර්ගයෙන් ජනතාවගෙන්ම ලැබෙන මුදල්. මම හැමදාම කියන දෙයක් තමයි මම නම් පාරවල් හදලා බෝඩ් ගහන්න යන්නේ නෑ. ඒවා මගේ සල්ලි වලින් හදන ඒවා නෙවෙයි. මිනිස්සුන්ගෙ පරිප්පු කිලෝ එකෙන්,හාල් කිලෝ එකෙන්, තේ කහට එකෙන් මේ එකතු කරන බදු මුදල් වලින් මේවා කෙරෙන්නේ.ඒකට අපි වගකියන්න ඕනෑ. නීත්‍යානුකූලව මේවට වග කියන්න අපි බැඳිලා ඉන්නවා. අපි මේවට වගකියන්න කර්මයෙන් බැඳිලා ඉන්නවා. මහජනතාව දුක් විඳලා හම්බකරන මුදල් අපතේ යනවා නම් ජනතාව සාප කරනවා. එතකොට ඒ ශාප වලට අපි ලක්වෙනවා.අපිට විනිවිදභාවයෙන් මේවා දැන ගන්න අවශ්‍ය නිසා තමයි මේ කාරනාව විමසා සිටියේ. හැබැයි ඒ අවස්ථාවේ ඔබතුමිය එය පැහැර හැරියා. ඊට පස්සේ අපි දැක්කා සභාවේ මුදල් යොදවන්නේ නෑ කියලා මේ කටයුත්ත යද්දි. හැබැයි සභා වාර්තාවක තියෙනවා කැබ් රථය ගොඩගැනීමට, ගෙනඒමට මුදල් යොදවලා තිබුණා. ඒ නිසා අපිට සිද්ධ වෙනවා මේක හාරලා බලලා, විමසලා බලලා මොකක්ද කෙරෙන්නෙ කියලා දැනගන්න. අපි දන්නවා මේ වගේ සිදුවීමකදී සභාවේ වාහනයකට රක්ෂණ හිමිකම් ලැබෙන්නේ කොහොමද කියලා. වාහනයක හානිය රුපියල් ලක්ෂයක් නම්, අපිට ලක්ෂයක හිමිකමක් ලැබෙන්නෙ නෑ. අපිට සාමාන්‍යයෙන් 60% ක 70% කට පහල මුදලක් තමයි ලැබෙන්නේ. පූර්ණ රක්ෂණයක් දාලා තිබ්බා කියලා සම්පූර්ණ මුදලක් ලැබෙනවා ඉතාම අඩුයි. එහෙමනම් වාහනය සම්පූර්ණයෙන් විනාශ වෙන්න ඕනෑ. මේ කාරණයේදී අලාභහානි වූ වාහනයට රක්ෂණයෙන් කීයක් ලැබෙනවාද, පූර්ණ හිමිකම හම්බ වෙනවා කීවට අද වෙනකම් රක්ෂණ සමාගමෙන් සම්පූර්ණ හිමිකම හා ඇස්තමේන්තුවට ඉන්වොයිස් එකක් හෝ ලිපියක් දීලා තිබනවාද. එහෙම නම් ඔබතුමිය ඒවා සභාවට ඉදිරිපත් කරන්න. මේ යෝජනාව ඔබතුමියටත් නිර්දෝශී වෙන්න හොඳ අවස්ථාවක්. ඒ වගේම පූර්ණ රක්ෂණයකදී අපි දන්නවා වාහනයකට තියෙනවා අතිරේක ආවරණ. ගංවතුර වේවා, ස්වභාවික ආපදාවක් වේවා, කැරලි කෝලාහල වේවා අපි මේවා ඇතුලත් කරන්න ඕනෑ. මේ රක්ෂණයට ඇතුලත් වෙලා තියෙන ආවරණ මොනවද, ඒ ආවරණ වලට මේ වියදම් යටත් වෙනවා ද කියන

දේ අපට දැනගන්න ඕනෑ. මේ වන විට කැබ් රථය ප්‍රතිසංස්කරණය කරන්නේ කොහෙද. කටින් කීවට බෑ. සභා පණතේම තියෙනවා සභා වාර්තාවක් සම්මත කලාම අධිකරණයේ සාක්ෂියක් ලෙස පිළිගන්නවා කියලා.ඒ නිසා මේවා සභා වාර්තාවේ සඳහන් වෙන්න ඕනෑ. නැත්නම් අපේ දරුවන්ටත් අධිහාර ගෙවන්න වෙනවා. එහෙම අවස්ථා ලංකා ඉතිහාසයේ නඩු තීන්දුවල තියෙනවා. ඒ නිසා අපට මේවා පැහැදිලිව විනිවිදභාවයෙන් ලිඛිත සාක්ෂි ඇතිව දැනගන්න ඕනෑ. මේක අපේ පැත්තෙන් කරන අසාධාරණ ඉල්ලීමක් නොවෙයි. ඔබතුමියටත් හොඳයි නිර්දෝෂී වෙන්න. ඊළඟට මේක ප්‍රතිසංස්කරණය කරද්දි ඒක අධීක්ෂණය කරන්නේ කවුද. සභාවේ නිලධාරියෙක් ඒක බලන්න පත්කරලා තියෙනවද. අපේ පෞද්ගලික වාහනයක් අනතුරක් වෙලා හදන්න දැම්මම ඒක බලන්න නොගියොත් ඒක හරියට වෙන්නෙ නෑ. ගිහින් බලන්න ඕනෑ ඒක හරියට වෙනවද, හරියට කෑලි ටික දාලද, තිබ්බ කෑලිම ආයේ හදලා දාලද. මේක අධීක්ෂණය කරන්න කවුරු හරි පත් කරන්න ඕනෑ. එහෙම නිලධාරීයෙක් පත් කරලා තියෙනවාද.ඒ කවුද. එහෙම නිලධාරියෙක් ඉන්නවනම් ඔහු මේ වෙලාවේ අපට ඉදිරිපත් කරලා මේ වන විට වාහනය මේ තත්ත්වයේ තියෙන්නෙ කියලා අපට පැහැදිලි කරන්න. ඒවා මෙහි විනිවිදභාවයට අවශ්‍ය කාරණා. සාක්ෂි සහිතව මෙතෙන්ට ඉදිරිපත් කරන්න. නැතුව මේක හැමදාම ගිරිය කඩාගෙන කෑ ගැහුවට ඔබතුමිය නිර්දෝෂී වෙන්නෙත් නෑ. මේ ප්‍රශ්නය විසඳෙන්නෙත් නෑ. අනික ඔබතුමියට මෙම ප්‍රශ්නයට වග කියන්න සිදු වෙන්නේ නැහැ අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ එතුමාගේ කාර්ය මණ්ඩලයෙන් කැඳවීමක් ඇවිල්ල කියලා ගියානම්. එහෙම කැඳවීමක් ආවා නම්ලිඛිතව තියෙන්න ඕනෑ. එහෙම ලිපියක් තිබෙනවා නම් ඒ ලිපිය ඔබතුමිය සභාවට ඉදිරිපත් කරන්න. එතකොට මේ චෝදනාවලින් ඔබතුමිය නිදහස්. ඊට පස්සේ අපට රක්ෂණයේ මුදල් තියනවනම් ප්‍රශ්නයක් නෑ. නීත්‍යානුකූලව ඔබතුමිය ඒ ආවරණයට යටත් වෙලා තියෙනවා. එතකොට ඒ අවශ්‍ය කරන ඉතිරි දේපල සම්පාදනය කරලා දෙන්න කිසි ගැටලුවක් කාගෙන්වත් ඇතිවෙන්නේ නෑ. අන්තිමට ඔබතුමිය නායකයා රකින්න ගිහින් අද ඒ නායකයෝ ඔබතුමිය ආරක්ෂා කරනවාද. මේවා හැමෝටම හොඳ පාඩම්. මේ රටවල් කොහෙන් හරි හැදෙන්න ඕනෑ. එහෙම නම් ගමේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ඉඳලා ජනාධිපතිවරයා දක්වා මහජන මුදල් අවභාවිතා කරන්න බය වෙන්න ඕනෑ. ග්‍රාම නිලධාරීගේ ඉඳලා අගවිනිසුරුතුමා දක්වා සියළු රාජ්‍ය නිලධාරීන් මේවා අවභාවිතා කරන්න බය වෙන්න ඕනෑ. නැතුව මේ රටවල් කවදාවත් හැදෙන්නෙ නෑ. අපට අවශ්‍ය වුනේ මේ දේවල් සාක්ෂි සහිතව දැන ගන්න. නැත්නම් අවසානයේදී මේ දේවල් වලට එකඟ වෙලා යම් හෙයකින් තමන්ට පක්ෂපාතී රජයක් තියනකල් මේ දේවල් ගැටලුවක් නැති වෙයි. කවදහරි මේ දේවල් වලට වග කියන මේ වැරදිකරුවන්ට දඬුවම් දෙන පාලකයන් මේ රටවල්වල බිහි වෙනවා. නැත්නම් සොබාදහමින් හරි මේ දේවල් වෙනවා. අන්න එහෙම වුනු දවසක මේ සියලු දේවල් යලි ඇදෙනවා. එහෙම ඇදෙද්දි මේ දේවල් වලට පක්ෂපාතී වූ සියලු දෙනාටම වග කියන්න වෙනවා. මේ දේවල් අපේ කර පිට දාන්න බැහැ. ඒක නිසා මේ කාරණා සම්බන්ධයෙන් ලිඛිතව සාක්ෂි සාධක ඉදිරිපත් කරලා ඔබතුමිය මේ චෝදනා වලින් නිදහස් වෙන්න. එතකොට අපිටත් පුළුවන්මේ කාරණය මෙතනින් එහාට නිමා කරන්න. ඒ නිසා මේ කාරණාව පිළිබඳ, මා කතා කරපු දේවල් පිළිබඳ සලකා බලා ලිඛිතව මේ දේවල් ඉදිරිපත් කරලා මේ කටයුත්ත නිමා කරන්න කියලා ඔබතුමියගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මේ කාරණාව නිතරම මතුවන කාරණාවක්. විශේෂ මහා සභාවක් හරහා හරි මේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලබා දෙන්න ඔබතුමිය කටයුතු කිරීම පිළිබඳව මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා.අපේ උප සභාපතිතුමා කීවා 225ටම බනිනවා කියලා. දැන් මේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට විතරද 225 ම එපා කියලා බැන්නේ. යහපාලන ආණ්ඩුව අපි කරගෙන යනකොටත් 225ම එපා කියලා උද්ඝෝෂණ තිබ්බා. හැබැයි අපි තේරුම් ගන්න ඕනෑ මේ සමාජයම දූෂිතයිනම්,මේ සමාජයම පිරිහිලා නම්, සංස්කෘතිය ගුණධර්ම වලින් පෝෂිත නැත්නම්, ඒවා පරිහානියට ලක් වෙලා නම්,හොඳ මන්ත්‍රීවරු නිර්මාණය වෙයිද. මේ

මන්ත්‍රීවරු නිර්මාණය කරන්නේ දූෂිත තැනින්. මම මේ කියන්නේ 225ම හොඳ නෑ කියන සියලු දෙනාගේම සර්වජන ඡන්ද අයිතියෙන් තමයි යහපාලනයෙන් 225 ම තේරී පත් වුනේ. පසුව 225ම හොඳ නෑ, හොරකම් කලා, මහ බැංකුව කෑවා, රට වික්කා, මුස්ලිම් ජාතියට මේ රට පාවා දුන්නා, අපේ ආගම නැති කලා ජාතිවාදය අපට වැදගත් වෙනවා කියලා ඕක මාකටින් කරලනේ ආවේ. එතකොට මේ මිනිස්සු ආයෙ 225ම පත් කලේ ඔය අය අතරිනුයි. කවුරුහරි පිළිගන්නවද හොර ඡන්ද දැම්මා කියලා. ඒ වගේම මම මේ අරගලය ගැන විශේෂයෙන්ම කතා කරන්නේ රටක තිබුණු දුෂ්කරම තත්වයට රට පත්වුනා. ඒකට යම් යම් කරුණු කාරණා බලපෑවා. මම නම් කොයි වෙලේවත් දේශපාලන පටු ආත්මාර්ථකාමී කෝණයකින් බලන්නෙ නෑ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා, මෛත්‍රීපාල මැතිතුමාගේ ආණ්ඩු කාලයේ යහපත් දේවල් යහපත් විදිහට දැක්කා. නරක දේ නරක විදියට දැක්කා. ගෝඨාභය මැතිතුමාගේ කාලේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලේ හරි දේ ඔබතුමාලා එක්කම මේ සභාවේම හරි කිව්වා. නරක දේ නරකයි කියලත් කිව්වා. දේශපාලනය නොකර, දේශපාලනය ගැන අත්දැකීමක් නොමැති රාජ්‍ය නායකයෙකුට මේ රට පාලනය කරන්න බෑ කියලා අපි කිව්වා.රටේ යුද්ධය අවසන් කරපු ප්‍රගතිශීලී නායකයෙක් මහින්ද රාජපක්ෂ කියන්නේ. අදටත් මම මහින්දට බනින්නේනෑ.එදා බැන්නෙත් නෑ. එදා අරලියගහ මන්දිරයට මිනිස්සු ගියෙත් එතුමා ගැන හැඟීමකින්. ඒ වගේම මේ ප්‍රශ්නයේදී ඔබතුමාලට මේ ගැන ප්‍රශ්න කිරීමේ අයිතිය, මේකෙ වරදක් වෙලා තිබෙනවා නම් සෙවීමේ අයිතිය, මේ ප්‍රාදේශීය සභාවේ මුදල් අවභාවිතා වෙනවා නම් ඒ පිළිබඳ දැන ගැනීමේ අයිතිය, තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය.මගේ අදහස් දැක්වීමේ අයිතියත් මට තිබෙනවා. මම මේක නිදොස් කොට නිදහස් කරන්න කැමැති කෙනෙක් නෙවෙයි. මෙතුමියට එදා අරලියගහ මන්දිරයට කැඳවීමේ ලිපියක් තියෙනවද කියලා ඇහුවා. හැබැයි අපිට පළාත් පාලනයෙනුත් කැඳවන්නේ එදා ඉහළම දුරකථන මාර්ගයෙන්. ලිඛිතව එවන්නේ නෑ. එතකොට මෙතුමිය එදා එන්න කියලා කියපු එකටනේ ගිහිල්ලා තිබ්බේ. මේකට රක්ෂණ සමාගමෙන් මේ සියලුම මුදල් ටික ගෙවනවා. මීට පෙර මුදලක් ගෙවීම සම්බන්ධව සභාවට දැම්මා. අපි මෙතුමියට විරුද්ධව චෝදනා කරන්න හරි මෙතුමියගෙන් යමක් අය කරගන්න හරි මෙතුමිය මේකට කරපු අධිභාරය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග අරන් එලවන්න හරි ඉස්සරලා ඒක සභාවේ අනුමත කලේ නෑ. වාහනය අපි ඉස්සරලා ගොඩ අරගෙන අපේ තැනට ගේන්න ඕනෑ. ඊට පස්සේ ඒක මෙතුමියගෙන්අය කරගන්න පුළුවන්. ඒකටවත් අනුමැතියක් දුන්නෙ නෑ. ඒ වාහනය බේරේ වැවේ තියාගෙන පරීක්ෂණ කරන්න, මෙතුමිය ගෙදර යවන්න, වාහන අවභාවිතාව සම්බන්ධව මෙතුමියට දඬුවම් කරන්න විදියක් නෑ. මේ වෙලාවේ වාහනය ගේන්න මෙතුමියත් බෑ කිව්වා නම් අපිත් අනුමත කරන්නෙ නැත්නම් ලේකම්තුමිය කොහොමද වාහනය ගේන්නේ. අපි ගෙනැල්ලා නීත්‍යානුකූල ක්‍රමවේදය තුළ මේක අත්පත් කරගන්න ක්‍රමවේදයක් තියෙනවා.ඒ තුළ අපි ඉන්නවා. මම හොයාගත්ත කරුණු අනුව මේ සභාවේ වාහනය සඳහා සියලු මුදල රක්ෂණ සංස්ථාවෙන් ගෙවනවා කියන තොරතුරු මට ලැබිලා තියෙනවා. ඒ නිසා වාහනය හදලා මේ මාසය ඉවර වෙන්න පෙර මේ සභාවට ගේන්න පුළුවන්කම තිබෙනවා කියලා මම හිතනවා. එහෙම නම් මේ ප්‍රශ්නය ඇතුලේ කිසිම අර්බුදකාරී බවක් මම දකින්නේ නෑ. ඔබතුමාලා මේ යෝජනාව දාලා මේ ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධව මම ඔබතුමාලාට ගෞරව කරනවා මෙතුමියටත් ස්තුතිවන්ත වෙනවා විශේෂ සභාවක් කැඳවලා මේ ප්‍රශ්නය කතා කරලා සමථයකට පත් කරගන්න අවස්ථාව ලබා දීම පිළිබඳව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද විශේෂ සභාවක් කැඳවලා පොදු දේපලක් සම්බන්ධව සාකච්ඡා කිරීමට කාලවේලාව ලබා දීම සහ ඒ අවස්ථාව ඉල්ලා සිටීම සම්බන්ධව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, සභාපතිතුමියටත්, ස්තුතිවන්ත වෙනවා. අපිට ප්‍රශ්නය තිබෙන්නේ අපේ සභාවේ කැබ් රථයට මොකද වුනේ. ඒක පියවන්නේ කොහොමද. ඒක හදලා නීත්‍යානුකූලව සභාවට භාර දෙන්නේ කොහොමද කියන කාරනා තමයි අපි ළඟ තිබෙන ප්‍රධාන ප්‍රශ්න. කෙසේ වෙතත් මම හිතන්නේ

දේශපාලන ඉතිහාසයේ දේශපාලනය කරන්න ඇවිල්ලා ඉතාම අසීරුතාවයට පත් වුන, ඉතාම අසරණභාවයට පත් වුන හා තමුනට විද දරා ගන්න බැරි අලාභ හානියකට පත්වීම අපේ ගරු සභාපතිතුමියට මම හිතනවා ස්ථානයක් හිමි වෙනවා. අපි මේ සභාපතිතුමිය පත් කර ගැනීමට විශාල සහයෝගයක් ලබා දීපු කණ්ඩායමක්. සභාපතිවරයා කවුරු වුනත් අපි සියළු දෙනා සුහදශීලීව ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කරලා ඒ අවශ්‍ය කරන විධි විධාන ප්‍රදේශය දියුණු කරන්න අවශ්‍යකරන වපසරිය ගොඩනැගීම තමයි අපි එදා දවසේ බලාපොරොත්තු වුනේ. මට හිතෙනවා අපි අතර තිබුණ සබඳතාවය දැන් ගිලිහිලා ගිහිල්ලා තිබෙනවා. ඉතාම සුහදශීලීව සානුකම්පිතව විසඳාගත යුතු ප්‍රශ්නයක් මහා ලොකු ප්‍රශ්නයක් බවට පත්වෙලා මේ විශේෂ සභාවක් කැඳවලා තිබෙන්නේ. අපේ සභාවේ තිබෙන මේ වටිනාම වාහනය මේක වුන දවසේ සිටම හරියට පැහැදිලි කිරීමක් කලා නම් මේක මෙපමණ දුරදිග යන්න අවශ්‍යතාවයක් නැහැ. මෙතනදී මේ කරුණු කාරණා හරියට පැහැදිලි කිරීමක් නොවීමත් මේකට හේතු කාරණා වෙලා තිබෙනවා. මේ සභාපති පුටුවට කවුරු පත් වුනත් තමන්ගේ නායකයා කැඳවනකොට ඕනතරම් ඒ අවස්ථාවලට ගිහිල්ලා ඇති. කවුරුත් ඒ පිළිබඳ හොයන්න ගියේ නෑ. අද අපි මේ කතාකරන කාරණාව මන්ත්‍රීමණ්ඩලයටත්, සභාපතිතුමියටත්, ලේකම්තුමිය ඇතුළු රාජ්‍ය නිලධාරීටත් හොඳ පාඩමක් කියලා තමයි මම නම් දකින්නේ. එකක් තමයි අපි මේ ජනාධිපතිවරයා කැඳවපු ආකාරය සම්බන්ධව ක්‍රියා නොකිරීම. මේ ඔක්කොමදේශපාලන වශයෙන් විසඳාගත යුතු කාරණා. කොළඹට කැඳවීමක් කලා නම්, ඒක ලිඛිතව නොවේ නම් සිද්ධ වුනේ මෙතුමාට තිබුනා මේකට පිහිට වෙන්න. රාජ්‍ය ආයතනවල වාහන 10 ක් 12 ක් තමයි මේ විදියට විනාශ වුනේ. ඒ වාහන පිළිබඳව සොයා බැලීමක් කලේ නෑ. ඔය පුටුවේ කවුරු හිටියත් එදා ඒ අවස්ථාවට සහභාගී වෙනවා. එදා මෙතුමියගේ නිවසට අලාභහානි වුනා. සභාපතිතුමියනි, ඔබතුමියත්, ලේකම්තුමියත් අද මේ සභාවට සත්‍ය කරුණු ඉදිරිපත් කරලා දැන් වාහනය තිබෙන්නේ කොහෙද, මේ සභිකයින්ට මේකේ ඇත්ත කරුණු පහදලා දුන්නා නම් එහෙම නැත්නම් මේ වෙනකොට වාහනය හදලා මෙහේ ගාල් කරලා තිබුණා නම් ගැටළුවක් නෑ.මොනවද අලාභහානි, වාහනය තියෙන්නේ කොහෙද, ඉන්ෂුවරන්ස් එකෙන් මෙපමණ මුදලක් ගෙවනවා, ඉතුරු මුදල මම අතින් ගෙවනවා කියලා මොනවා හරි කියන්න ඕනෑ. මෙතන මේ අයට ප්‍රශ්නේ තිබෙන්නේ දේපල අලාභහානි වුනා වගේම අධිභාරයකට යටත්වෙලා යම් දවසකදී අපිත් සභාවේ නැති දවසකදී හරි මේක ගෙවන්න සිද්ධ වෙයි කියන බය සහ චකිතය තමයි අපේ මන්ත්‍රීවරුන්ට තිබෙන්නේ. ඒ නිසා මේ කාරණාව පැහැදිලි කරලා මේක අවබෝධ කරගෙන මේ වෙලාවේ අපි මේ කටයුත්ත නිවැරදි කර ගන්න අවශ්‍ය පිළියම ඔබතුමිය පැහැදිලි කරලා ලේකම්තුමිය ලිඛිතව මේ සභාවට දැනුවත් කරලා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව තීන්දු තීරණවලට එළඹිලා මේකට අවශ්‍ය කරන පිළිතුරු ලබාගනිමු කියලයි මගේ අදහස.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විශේෂ සභාවක් කියලා ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳ විශේෂයෙන්ම සතුටු වෙනවා. විශේෂ සභාවක් තියන්න මන්ත්‍රීවරු පිරිසක් අත්සන් කරලා දීපු දෙවන අවස්ථාව මේක මම හිතන්නේ එම ලිපියේ මේ මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා ඉදිරිපත් කරපු පළවෙනි කරුණ තමයි මැයි 09 වෙනිදා අපේ රටේ විශාල අර්බුදයකට හේතු වුනු අරගල භූමියේ සිදුවීමත් සමග ඇතිවුනු විපර්යාසයයි. ඒක අපි සියළු දෙනාම ඉතාම හොඳින් දන්නවා. මැයි මාසයේ 09 වෙනිදා මේ සිදුවීම සිදු වුනා. මැයි මාසයේ 24 වෙනිදා තමයි සභාව තිබුනේ. ඒ මහා සභාවට ඔබතුමිය විසින් ඒ පිළිබඳව අනාවරණය කලා. ඒ අනාවරණය කරනකොට මේ හැම ගරු මන්ත්‍රීවරයෙක්ම අදහස් ප්‍රකාශ කලා. න්‍යාය පත්‍රය ආරම්භයේදී ඒ පිළිබඳ සභාව දැනුවත් කරලා වෙනත් කරුණු යටතේ සෑම මන්ත්‍රීවරයෙකුටම ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීලා තිබුනා. ඒ අවස්ථාවේදී ඒ පිළිබඳව මම දක්වපු අදහස් ස්ථාවරව ඒ ආකාරයෙන්ම වෙනසක් නැතිව අදත් කියනවා. මම සඳහන් කලා නිල වාහනයක් වනාහි රාජකාරී කටයුතුවල වගේම එක් එක් අමාත්‍යාංශවල, පක්ෂ වල සාකච්ඡා, රැස්වීම්, කැඳවීම් වලදී පාවිච්චි කරන්න කිසිම ගැටළුවක් නෑ. ඒක නීතියේ කාටවත් අභියෝගයට ලක් කරන්න බෑ. විධිමත් කැඳවීම පිළිබඳව ලේකම්තුමිය කොමසාරිස්තුමා, ඊටත් එහා ඉන්න උසස් නිලධාරීන් හැම කෙනෙක්ම මේ සිදුවීමත් එක්ක වගකිවයුතු වෙනවා. තාම පරීක්ෂණ තියනවා. මේක

තාවකාලිකව ගියත් මේ පරීක්ෂණය අහෝසි වෙන්නේ නෑ. විශේෂයෙන්ම අපිට සභාවක් හැටියට ඒ පරීක්ෂණ නිමවනතුරු ඒ තොරතුරු අනාවරණය වන තුරු දැනට මම හිතන්නේ තොරතුරු අරන් තියෙනවා. ඒ තුල එතෙක් අපි සභාවෙන් ඒ පිළිබඳ තාම වියදම් කරලා නෑ. මම හොඳින් විමසිලිමත්ව ඉතාම අවධානයෙන් ඒ පිළිබඳව බලාගෙන හිටියා. තාම එහෙම ගෙවීමක් මේ ආයතනය තුලින් මහජන මුදල් ඉල්ලීමක්වත් එහෙම අවස්ථාවක් මේ වෙනකම් මුදල් කමිටුවට හෝ ඇවිල්ලා නෑ. ඒ නිසා මම හිතනවා තාම අපට ඒ පිළිබඳව ප්‍රශ්නයක් නෑ. විශේෂයෙන්ම මේ පිළිබඳව කැබ් රථය ඉක්මනින්ම අළුත්වැඩියා කරලා එවනවා නම් ඒක ඉතාම වටිනවා. කැබ් එකට සභා අනුමැතියක් දීලා තිබෙනවා තාම අළුත්වැඩියා කටයුතු ඉවර නෑ. නීතිපතිගෙන් අනුමැතිය ලැබුනාම තමයි ඒ අළුත්වැඩියාව ඒ අයට කරන්න සිදුවෙලා තිබෙන්නේ. අධිකරණ කටයුතු නිසා යම් යම් පසුබෑම් සිද්ධ වෙලා තිබෙනවා. මේ පිළිබඳව විශේෂයෙන්ම සතුටු වෙන්න පුළුවන් පූර්ණ රක්ෂණයක් මේ සභාවේ අනුමැතිය යටතේ ලේකම්තුමිය විසින් සිදු කරලා තිබෙනවා. ඒ නිසා අපිට සභාවේ මහජන මුදල් මේකට යන්නේ නැතුව ඒ අවාසනාවන්ත සිද්ධියට මුහුන දුන් මේ වාහනය අපට යථා තත්වයට පත්කරගන්න ඒ ආයතනය තුලින් පුළුවන් වෙයි කියන එක විශ්වාස කරනවා. ඒ පිළිබඳව අපේ කිසිම වෙනස්වීමක් නෑ. තාම සභාවෙන් ගෙවලත් නෑ. ගෙවන්න අවස්ථාවක් උදාවෙලත් නෑ. ඒ අවස්ථාවක් ආවොත් අපි අපේ ස්ථාවරය ප්‍රකාශ කරන්නත්, ගත යුතු ක්‍රියාමාර්ග ගන්නත් පසුබට වෙන්නේ නෑ. නමුත් මම එහිදී අවධාරණය කලා අපේ සභාවේ වාහනය අවභාවිතා වුන අවස්ථා බොහෝයි. එකින් එක සඳහන් කරන්න කාලය මදි. මෙතුමියගේ කාල පරාසය තුල මම ඉතා වගකීමෙන් කියනවා එදත් කීවා මේ සිදුවීම හැරුණුකොට ඒක අපි තාම නිශ්චිතව දන්නේ නැති වුනත් කිසිම චෝදනාවක් වාහන අවභාවිතාව පිළිබඳව ඇතිවෙලා නෑ. සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලේ එතුමා මෙහේ ඉන්නකොට වාහනය කොළඹ තිබුනා. ඒ අවස්ථාවේ එතුමාගෙන් අහනකොට මොනවා කරන්නද මචං කීවා. අපිත් ඒ ගැන ආයේ ප්‍රශ්න කලේ නෑ. ගාමිණී ගුණදාස මැතිතුමා සභාපතිවරයා ඉන්නකොට වරකාපොල මේ සභාවේ කෙනෙකුගෙත් නොවෙයි වෙන කෙනෙකු බස්සන්න ගිහින් ඉන්නකොට හැප්පුනා. විශ්‍රාම ගිහින් ඉන්න අපේ ජයසිංහ මහත්මයා සාක්ෂි දරයි. නමුත් අපූරුවට නීත්‍යානුකූලව ඒක රියදුරා ඉදිරිපත් වෙලා ඒකට රක්ෂණ වන්දි අරගෙන යථා තත්වයට පත්කරගත්තා. එහෙම අවස්ථාත් තිබුනා. මේ වාහන අවභාවිතාව පිළිබඳ අපට කියන්නබොහෝ දේතිබෙනවා. මේ පිළිබඳව අපි විමසිලිමත්වබලා ඉඳිමු. තාම ඒක අකටයුත්තක් වෙලා නෑ කියන ස්ථාවරයේ මම ඉන්නවා. සභාව තාම පාඩුවක් වෙන ගෙවීමක් කරලා නෑ. රක්ෂණයෙන් ඒක සම්පූර්ණයෙන්ම ගෙවනවා නම් ඒක ඉතාම වාසනාවන්තයි. ඒ තත්වයට පත්වීම පිළිබඳව. මේ කැබ් රථය පිළිබඳ එදා හිටපු ස්ථාවරයේම අදත් මම සිටිනවායි සපථ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එදා මැයි මාසයේ 09 වැනිදා කොළඹ නීති විරෝධී රැස්වීමක් පවත්වලා ඒකට සහභාගි වෙන්න ගියා කියන එක තමයි මූලික වශයෙන් අපට චෝදනා එල්ල වෙලා තිබෙන්නේ ගරු උප සභාපතිතුමනි, එතන නීති විරෝධී රැස්වීමක් වත් වෙනත් සිතුවිල්ලකට අපි ගියා නෙවෙයි. අපිට පක්ෂයෙන් කවදත් උපදෙස් හා ඒ දැනුම් දෙන්නේ දුරකථන ඇමතුමකින්.ඒ සඳහා අපි මෙතෙක් කල් ක්‍රියා කළා. මම හිතන්නේ ඔබතුමා මෙතෙක් කල් ඒ විදිහට තමා ක්‍රියා කලේ. අපිට හැම දෙයක්ම ලිඛිතව ලැබෙන්නෙ නෑ .ගරු සභාපතිතුමා ඒ දවස් වල දිගින් දිගටම කතා කරලා යම් යම් උදව් ඉල්ලපු අවස්ථා තිබෙනවා. වෙන මොකුත් හේතුවක් නොවෙයි එදා පළාත්පාලන මැතිවරණයට නාම යෝජනා දෙනකොට ගරු සභාපතිතුමියට මරණ තර්ජන එල්ල කරද්දී එතුමිය මාව ඇතුළත් කර ගන්න ඕනෑ කියලා මරණ තර්ජන වලට බියේ පසු බහින් නැතිව ඒ නාම යෝජනාව දිය යුතුයි කියන ස්ථාවරයේ ඉද්දි ඒ සඳහා ශක්තියක් වුණ ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා ඒකට අවස්ථාව ලබා දීපු එකට කළ ගුණයක් වශයෙන් මට මෙතුමියත් , ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාත් අයින් කරන්න බෑ.එතුමාම සම්බන්ධ වෙලා හිටපු නිසා ගරු සභාපතිතුමා මගින් නිතරම උදව් ඉල්ලුවා. මට ඒක ඉල්ලගත්තා ඒ වගේම මේ ප්‍රදේශයේ මාර්ග ගණනාවක් පිළිසකර කර දෙන්න කියලා අපි ඉල්ලීම් කරලා තිබුණා. මේ අලව්ව ප්‍රදේශයේ විශාල මාර්ග සංඛ්‍යාවක් කාපට් කරන්න, සංවර්ධනය කරන්න සැලසුම් සකස් කරලා තිබුණා. ඒ සඳහා අරලියගහ මන්දිරයට යන්න එපොයිමන්ට් එක අපි දැන්මාම ඒ සඳහා

අග්‍රාමාත්‍යතුමාට ආරාධනා කරන්න දිනයක් මට ලැබුණා. ඒ සඳහා මම යන්න යනකොට ගරු සභාපතිතුමියටත් ආරාධනාවක් කිව්ව නිසා මමත් ඒ වාහනයේම එක්ක යන්න කියලා එතුමියගෙන් ඉල්ලීමක් කරා හැබැයි එකේ කිසිම නීති විරෝධී කටයුත්තකටවත් වෙනත් කිසියම් දෙයකට නොවෙයි. මේ ප්‍රදේශයේ සිදුවන සංවර්ධන කටයුතු වලට අඩිතාලම දාන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි හිටපු සභාපති තුමාගේ නම කියැවුණා. අපිත් සමග මොන මොන ප්‍රශ්න මතු වුවත් එතුමාගේ රෝගී තත්ත්වය වෙලාවේ එතුමාට සහයෝගය දක්වන්න පෙළඹුණා.අපි සභාවක් වශයෙන් සභාවේ කටයුතුවලට සහයෝගය දුන්නා. ඒ වගේම ගරු සභාපතිතුමියට කුමන හෝ ආකාරයකින් ආරාධනාවක් ලැබුන නිසා තමයි. එතුමිය ඒ අවස්ථාවට සහභාගි වුණේ. සභාවන් වල සිදුවුන අවභාවිචන් පිළිබඳ මේ සුළු කාලෙට අපි දැනගත්ත දේ අනන්තයි. නමුත් අපි කිසිම අවස්ථාවක ගරු සභාපතිතුමාට ඒ සම්බන්ධව විරුද්ධ වුණේ නෑ.එතුමියට ඒ අවභාවිතාව පිළිබඳව චෝදනා කරනවානම් මෙතුමා සභාපති ධූරය ආවරණය කරන කාලයේ මේ ප්‍රදේශ ඒ පිටතට උලපනේ පැත්තට වාහනය රැගෙන ගියාට අපි අවභාවිත කළා කියලා කියන්නෙ නෑ. අපිට හෙට දින කුමන සභාපතිවරයෙක් පත් වෙයිද මෙතන ඉන්න ඕනෑම කෙනෙකුට යම් දිනක සභාපති ධූරයට පත් වෙන්න පුළුවන්. ඒ පත්වෙලා එන සභාපතිවරයාට තමන්ගේ වගකීම් හා යුතුකම් ඉටුකරන්න ඉටු නොකළ හැකි සෑම අවස්ථාවකම ඒ දේ කරන්න හැකියාව අවස්ථාව සැලසෙන ආකාරයෙන් අපි කටයුතු කිරීම ඉදිරියට එන සභාපතිවරුන්ට පහසුවක් වෙයි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දෙවෙනි කාරණයත් මේ එක්කම කතා කරමු. පළමු කාරණය පිළිබඳව අපි හැමෝම කතා කළා. ඒ නිසා, ප්‍රජාතන්ත්‍රවාදීව පක්ෂව විපක්ෂ වත් කතා කරන්න හැමෝටම අයිතිය තිබෙනවා. මේකෙදි අපි කණ්ඩායමක් හැටියට මේක අපි දැක්කේ වැරදි දෙයක්. මේ සභාවේනොවියයුතු දෙයක් හැටියට. නමුත් අපි දන්නවා අපි මන්ත්‍රීවරු එකට හිටියා නම් ඔය ප්‍රශ්නය ඇදෙන්නේ නෑ. මේක ඉහළ නායකත්වයේ දුර්වලකම් එක පැත්තකින්. අපිට කතා කරලා විසඳගන්න පුළුවන් ප්‍රශ්න මේවා . මොනවා උනත් අපි පුටුවෙ ඉන්න මිනිස්සු හැටියට එන කෙනාට එන්න අවස්ථාව තිබුණා. නමුත් දැන් ඒවට කරන්න දෙයක් නෑ.දැන් ඒවා වෙද්දි යම්කිසි අසාධාරණයක් වෙද්දී අසාධාරණයට සාධාරණ කරන්න අසාධාරණය කරපු අය යම් ක්‍රියාමාර්ගයක් ගන්න ඔනේ. එහෙම නැතිව දිගින් දිගටම අසාධාරණකම් වෙච්චි අයටමයි මේ ගැටලුව එන්නේ. විශේෂයෙන්ම දෙවෙනි කරුණ අපි ඉදිරිපත් කරන්න ලේකම්තුමිය කැබ් රථය පාවිච්චි කිරීම සම්බන්ධව.ඒ වගේම මේ තුන්වැනි කාරණය අපි ඉදිරිපත් කළේ මේ කරුණු කාරණා ගැන පැහැදිලි කිරීමක්.විශේෂයෙන්ම මේ ලේකම්තුමිය සම්බන්ධයෙනුත් මේ සභාවේ වාහනය සම්බන්ධයෙනුත්අවධානය යොමු වුනා. මේ සභාවේ වාහනයක් අපි දන්නා හැටියට අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති සන්ධ්‍යා කුමාර මැතිතුමා නිවසේ වාහනය තබාගන්න අපි සභා අනුමැතියක් දුන්නා. එතකොට මේ සභාවේ වාහනයක් පාවිච්චි කිරීම මම හිතන්නේ මේක මේ මහජනයාගේ මුදල් එක පැත්තකින්,අනෙක් එක අපි දන්නවා රාජ්‍ය නිලධාරියෙක් පරිපාලන නිලධාරියා හැටියට අපේ වාහනයක් පාවිච්චි කරනවා. අපි සාමාන්‍යයෙන් ගණනය කරලා බැලුවොත් මාසයකට විශාල වියදමක් මේ රජයේ මුදල් අවභාවිතාවෙනවා. අපි ලේකම්තුමිය ගැන වෛරයකින් ඉදිරිපත් කළා නොවෙයි. මේ කරුණු කාරණා එක්ක තේරුම් අරන් ඉන්නේ මෙතුමිය මේ සභාවේ 2023 අයවැය ඉදිරිපත් කරන කොට මෙතුමිය හොඳාකාරවම දැනගෙන හිටියා මේ අය-වැය පරාද වෙනවා කියලා. ඒක එතුමිය හා සභාපතිවරිය තේරුම් අරගෙන හිටියා. එතකොට මේකේ සැලසුම හය මාසයකට ඉස්සරලා තමා සභාපතිතුමිය ඇතුළු ලේකම්තුමිය සැලසුම් කළේ.මේකේ මම දකින්නේ රජයේ නිලධාරීන් කටයුතු කරනකොට විශේෂයෙන් ප්‍රාදේශීය සභාව ගත්තම ප්‍රාදේශීය සභාවේ අපි මහජන ඡන්දයෙන් පත් වෙලා ඇවිල්ලා තමයි අපි මෙතන ඉඳගන්නේ. එතකොට අපි වගකියන්න ඕන මහජනතාවට. රාජ්‍ය නිලධාරීන්ට, මහජනතාවට වගකීමක් නෑ. ඒ නිසා අපිට නිලධාරියෙක් සභා පනත අනුව

ක්‍රියාත්මක වෙනකොට මහජන නියෝජිතයන්ට සමානව සැලකීම මම හිතන්නේ රාජ්‍ය නිලධාරියෙක් හැටියට වගකීමක් දරණ ප්‍රාදේශීය සභාව තුළ සභාපතිතුමිය ට පස්සේ ඒ සියලූ වගකීම් ඉටු කරන්නේ සභාපතිතුමිය ටත් වැඩිය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය. එතකොට මේ කාර්ය මණ්ඩලය ලේකම්තුමිය මම හිතන්නේ මීට වැඩිය වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ කියන එක තමයි අපේ හැඟීම. මම හිතන්නේ එහෙම නොවී අපිත් සමඟ සුහදව පක්ෂ භේදයක් තියෙන්න බෑ. එතුමිය කාටත් එක සමාන වෙන්න ඕනේ. ඒක පාර්ශවීය සභාපතිවරයා කියන කියන දේම කරන්න ඕනෑ කියලා මේ පනතේ කොහෙවත් නෑ. ඒ නිසා මහජන නියෝජිතයෝ සියලු දෙනාත් එක්ක සුහදව කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව පනතෙහි යම් යම් දේවල් හා රීති මාලාවේ තියෙන ඒ දේවල් උපයෝගී කරගෙන ඉදිරියට වෙන්න තියෙන යම්කිසි ක්‍රියාමාර්ගයකට ඒකපාර්ශවීය කටයුතු කරනවා නම් ඒක මම හිතන්නේ අපිට පිළිගන්න බැරි කාරණයක්. විශේෂයෙන්ම මේ අවස්ථාවේ සඳහන් කරනවා අපි දන්නවා මම කාන්තාවකට කවදාවත් නිග්‍රහ කරන්න කැමැති කෙනෙක් නෙවෙයි. ගෞරව කරන කෙනෙක් ගරු සභාපතිතුමියනි අපි මේ කරුණු කාරණා සම්බන්ධව කොමසාරිස්තුමාට ආණ්ඩුකාරතුමාට දන්වලා තිබෙනවා. එතකොට එහෙමත් වුණේ නැත්නම් අපි මේකට නඩුවක් දානවා. ඔබතුමිය ගැන වෛරයකින් අපි මේවා ඉදිරිපත් කළා නොවෙයි. අපිට ඕනෑ මේවට තියෙන නීති මේ තත්ත්වය මොකක්ද කියලා ඒ දේවල් අපට පැහැදිලි කරලා තීරණයක් ගන්න හැටියට මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නාරද මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනා වල දෙවන කාරණයේදී ඒ ගැන අපි පොඩි දෙයක් කතා කරන්න ඕනෑ. දෙවෙනි කාරණයෙදී රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් යම් යම් අනුමත වරප්‍රසාද තිබෙනවා තමන්ට භුක්ති විඳිය හැකි. ඊට පරිබාහිරව යම් වරප්‍රසාදයක් ලබනවා නම් ඒ වරප්‍රසාදය ලබන්න නීත්‍යානුකූලව අවසරයක් තිබිය යුතුයි. ලේකම්තුමියටමොකක් හරි සභාවේ කාරණාවක් වෙන්න පුළුවන් නැත්නම් වෙන හේතු නිසා වෙන්න පුළුවන් වාහනය නිවස කරා යන්න දෙනවා නම් ඒක නීත්‍යානුකූල ක්‍රමවේදයක් තුළ ගේන්න ඕන . ලේකම්තුමියට මොකක් හරි යම් කාරණාවක් නිසා වාහනේ දෙනවා නම් රටේ පවතින නීතිය අනුව සභාවේ තියන ක්‍රමවේද අනුව ඒක නීත්‍යානුකූල අවසරයකින් භාවිතා කරන්න ඕනෑ. අපිට මේ කාරණය සම්බන්ධයෙන් තිබෙන්නේ එවැනි අදහසක්. එවැනි නීත්‍යානුකූල අවසරයකින් තොරව භාවිතයට දෙනව නම් අපි ඒක වරදක් විදිහට දකිනවා.විපක්ෂයක් විදිහට අපි දකිනවා  නීත්‍යානුකූල ක්‍රමවේදයක් උඩ නොදුන්නොත් ඒක අවභාවිතාවක් විදිහට. එතනින් එහාට ඒ කාරණය නිත්‍යානුකූල කරගෙන භාවිතා කළ යුතුයි කියන තැන තමා අපි ඉන්නෙ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභාවේ කැබ් රථය පිළිබඳව කතා කළා. කියන්නත් සන්තෝෂයි දැන් කැබ් රථය වැඩ ගොඩක් ඉවරයි. ඊයේ මහා සභාවෙත් අර්බුදයක් ආවා බැටරිය ගැන. මම සභාපතිතුමාට කීවාම බැටරි අරන් දෙන්නම් කියල එතුමිය කීවා අදාළ ආයතනයෙන් බැටරිය ලබා දුන්නා කියලා. ඒ වගේම ඊයේ දවසේ ගරු සභාපතිතුමිය ගේ සේවයට ඉන්න අයගේ දීමනාව කපලා දැම්මා. කියන්න ලැජ්ජයි මීට පෙර සභාපතිවරුත්ඔය මුදල අරගෙන තිබෙනවා.හැම සභාවකම සභාපතිවරු ඒ මුදල අරගෙන තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න කැමතියි අපේ ගරු සභාවේ උප සභාපතිතුමා  සභාපති විදිහට වැඩ බලන කාලය අලව්වේ ඉඳලා උලපනේ කිලෝ මීටර් 75 ක් තිබෙනවා යන්න එන්න 150යි ගමන් එකක් ආවම 300 යි. ඒ සඳහා ඩීසල් කොපමණ ප්‍රමාණයක් වැය වෙනවද ?. එතකොට ඒවා අවභාවිතාව නොවෙයිද?. ඒ වගේම ලේකම්තුමිය මම දන්න හැම ප්‍රාදේශීය සභාවකම ලේකම්වරයා මේ වාහනය පාවිච්චි කරනවා .ඔබතුමාලා ඒ ගැනත් හොයලා බලලා යම් සාධාරණයක් කරන්න. මම කැමතියි එත්තුමියට වාහනය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීමට.ඔබතුමාලා කොපමණ චෝදනා කලත්, මම මේ සභාවේ කාණු කැටයක්වත් අරගෙන නෑ .

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි කවුරුත් සමගියෙන් සභාව ගෙනියන්න ඕනෑ. එහෙම නැති නිසයි මේ ප්‍රශ්න ඔක්කොම.සන්ධ්‍යා සභාපතිතුමා ඉද්දී මම උපසභාපතිවරයා ලෙස කටයුතු කරන කොට අපි දැක්කා වැරදි. හැබැයි අපි කණ්ඩායමක් විදියට ඉන්න නිසා සභාපතිනේ මේ තීරණ ගන්නේ. එතකොට උප සභාපතිත් ඒ හා සමානයි. එදා අපි නිශ්ශබ්දව හිටියා. හැමදේම ආරම්භයේ වරදක් තිබෙනවා. ඒක මේ අපේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු හරි අවබෝධ කරගෙන ඉන්නවනම් කමක් නෑ. මේ ධර්මරත්න හේරත් කියන්නේ තනතුරක් පස්සෙ යන කෙනෙක් නෙවෙයි. මම දේශපාලනයට ආවේ ඒකෙන් හරි හම්බ කරගන්න නෙවෙයි. අපිට දුක තිබෙන්නේ මේ සභාවට ඇවිල්ලා පොඩි ලියුම් කැල්ලකින්, යෝජනාවකින් මේ බල ප්‍රදේශයේ අපට වැඩක් කරගන්න බෑ. සන්ධ්‍යා සභාපතිතුමා ඉද්දිත් අපිට ඕවා හරියට කරලා දුන්නේ නෑ. මුලින්ම ආරම්භ කළේ හැඩි පන්නල බොරළු දාන එක. අන්තිමට ලක්ෂ දෙකයි අපිට දුන්නේ.සන්ධ්‍යා සභාපතිතුමා ලක්ෂයක් දාලා ලක්ෂ තුන කරගත්තා. අන්තිමට මට චෝදනාවක් ආව සන්ධ්‍යා සභාපතිතුමා ජරාව කෑවා කියලා අන්තිමට එතන හිටපු ඒ කොන්ත්‍රාත්කරු කිව්වා ධර්මරත්න හේරත් මැතිතුමා කීයක්වත් හොරා කෑවේ නෑ කියලා. ඒකේ බොරලූ හරියට දැම්මෙ නෑ. ගමේ යන්න බැරුව ගියා. මම එකෙන් හම්බ කෙරුවෙ නෑ. ලේකම්තුමියත් සාක්ෂි දරයි. ඒ විදිහට අපි ඇවිදින් සහයෝගය දුන්නේ ගම්වල ජනතාවට රටට ජාතියට යමක් කරන්න. මේ සභාවට ආවට පස්සෙ මේ ක්‍රමවේදයේ වෙනසක් වුණා. නැතුව මෙතුමිය මුලින්ම සභාපති වුනානම් 2018 පෙබරවාරි ඡන්දෙන් පස්සෙ සන්ධ්‍යා සභාපති වෙනුවට මැතිණිය ආවා නම් ඒත් මම උප සභාපති වෙන්න ඉඩ තිබුණා. අවසානයේ සන්ධ්‍යා සභාපති තුමා මිය යනකොට උප සභාපති කියලා තනතුරක් පත් කරලා තිබෙනවා. මේ පනත අනුව. එහෙම නම් ඒ පනත අනුව ක්‍රියාත්මක කරන්නත් රටේ නායකයින් ගේ වගකීම විය යුත්තේ. ඒ අවස්ථාවෙදි පනත අනුව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මෙතන සභාපති පත් කිරීමේ වරදක් තිබෙනවා. මෙතුමිය හොඳයි නම් දැන් අලව්වේ සංවර්ධනයක් තියෙන්න ඕන. නමුත් නගර සංවර්ධනය දැන් නැවතිලා තිබෙනවා. ඒ වගේම තමයි මේ කැබ් රථය. මම වැඩ බලන කාලයේ ලේකම්තුමිය තමයි මට කීවේ කැබ් රථය පාවිච්චි කරන්න කියලා. මම ඒ සභාපති පුටුවෙ වැඩි වුණේ නෑ. ඒ නිසා මම කියන්න කැමතියි මම පසුකාලිනව තමයි ඔය කැබ් රථය යන්න පටන් ගත්තේ. මම උලපනේ ඔය කැබ් රථයේ ගියා. මම කැමතියි මගෙන් අලාභයක් වෙලා තිබෙනවා නම් ඒ මුදල ගෙවන්න. තෙල් මිල වැඩි කාලය නෙවෙයි මම උලපනේ ගියේ. මම ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ දෙවැනි දා වෙනකම් විතරයි ගියෙ. දැන් මේ අවුරුද්දත් ඉවරයි. මේ අවුරුද්දේ ඔය තෙල් මිල උපරිමයට ගියේ. මම දිනපතා ම ඔය කැබ් රථය පාවිච්චි කළේ නෑ.ඒ දවස් වල කොරෝනා වැඩි නිසා දිනපතාම සභාවට ආවෙත් නෑ. ලිපියක් අත්සන් කරන්න ඕන දින බලලා තමයි ආවේ. මම වැඩ බැලුවේ මාස තුනයි.ඒ කාලසීමාවේ මම ගියපු දින පොත් වල ලියලා ඇති. ඒ ටික ගණන් හදලා බලන්න පොඩි ගානක් නම් මම ගෙවන්නම්.

ලේකම්තුමිය වාහනේ ගියා කියලා ඕක සාමාන්‍ය දෙයක්. මේ සිද්ධියත් එක්ක මෙහෙම අහන්න සිදුවුනේ. මේ සම්බන්ධව නීත්‍යානුකූල බවක් තියෙනවද? මට දැනගන්න ලැබුණා ආණ්ඩුකාරතුමාගේ, කොමසාරිස්තුමාගේ අනුමැතියක් තියෙනව කියල. කෙසේ වෙතත් ඒ පිළිබඳව අප දැනුවත් කරන්න. ඊළඟට මේ අයවැය සම්බන්ධව, අයවැය මුලා වීමක් වුණේ. ලේකම්තුමිය 18 වැනිදාට කලින් එවන්න කියලා ලිපියක් එව්වා. අපි 17 දවල් දොළහට කලින් ඒ චෝදනා පත්‍ර භාර දුන්නා. දින තුනක් ඇතුළත අපට එවන්න කීවා නම් අපි කඩිමුඩියේ අපේ යෝජනා ටික විරෝධතා ටික ඉදිරිපත් කරනවා. ඒ අනුව ආණ්ඩුකාරතුමා දින තුනේ නීති බලලා කෙරුවනම්, අපි මෙතන නොමග ගිහින් තිබෙනවා. ආණ්ඩුකාරතුමා මේ ලියුම බලන්න ඕන පරික්ෂා කරලනේ තීරණයක් ගන්න තිබුණේ. ඒක නොවීමෙන් අපි මෝඩයෝ කියන එක අන්තිමට සමාජගත වෙන්නේ. අපි කරපු දේවල් එකක්වත් හරි ගිහිල්ලා නෑ. ඒ වගේ සිදුවීම නිසා තමයි අපිට මේ ප්‍රශ්න. ඒ වගේම මේ වයඹ තීන්දුවයි, ඌවෙ තීන්දුවයි බලන්න. මේක කරල මෙතුමිය වහාම එළවලා ධර්මරත්න හේරත් හෙට අනිද්දා පුටුවේ වාඩිවෙලා රජා වගේ ඉන්න

නොවෙයි. අපි මේ එන අන්තිම වාර කීපය වෙන්න පුළුවන්. සභාව තියෙනකම් එනවා. ඒ නිසා මම අවසාන වශයෙන් කියන්නේ මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්න. ආණ්ඩුකාරතුමාටත් ලිපි තැපැල් කරලා තිබෙනවා. මොකද අපි කණ්ඩායමක් හැටියට ගන්න තීන්දුවක් විතරයි මේ. එහෙම නැතුව ධර්මරත්න හේරත් හිතුමතේ නායකත්වයක් අරගෙන නෑ. අපි කණ්ඩායමක් හැටියට ගත්ත තීරණයක් තිබෙන්නේ. මම කවදාවත් උප සභාපති හැටියටවත් කණ්ඩායම තුල හැසිරෙන්නේ නෑ. ඒක මගේ ප්‍රතිපත්තියක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම ඉන්න කණ්ඩායම් තීන්දුවත් එක්ක. හැබැයි අවංකවම මම කියන්න ඕනෑ ලේකම්තුමියගේ ප්‍රශ්නෙදි මම ලේකම්තුමිය ඕනෑවට වඩා හිර කරන්නේ නෑ. ඒක මගේ පුද්ගලික මතවාදයක්. ලේකම්තුමියට මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙන්නේ, ලේකම්තුමිය අවංකව වැඩ කරන නිසා. දක්ෂ නිලධාරිනියක් නිසා. මෙතන මේ ප්‍රශ්නය ගැට ගැසුනේ නෑ මට තේරෙන හැටියට. මම හොයලා බැලුවා කොමසාරිස්තුමාගේ පීඩනය එන්නේ ලේකම්තුමියට. එතුමිය දක්ෂ නිලධාරිනියක්. අපි ඉතිහාසයේ වැඩ කරලා තිබෙනවා. අවංකව හොඳට වැඩ කරපු කෙනෙකුට අපිට එහෙම කියන්න බෑ. එහෙම කිව්වොත් අපිත් කුහකයෝ වෙනවා. මම කියන්නේ මේ ප්‍රශ්නේ මෙතරම් දුර ගියේ මේ ප්‍රශ්නයත් එක්ක. මේ ඔක්කොම ප්‍රශ්න අපිට කතා කරලා මුලින්ම විසඳ ගන්න තිබුණා. ලේකම්තුමිය අපේ සභාවට ගොඩක් වැඩ කළා. කුලියාපිටිය හිටිය, නාරම්මල හිටිය, දක්ෂ නිලධාරිනියක් කියලා අපි අවංකවම කියන්න අවශ්‍යයි. හොඳ කෙනෙකුට හොඳ නෑ කියලා මට කියන්න බෑ. එතුමියට හොඳ සේවයක් කලා. එතුමිය එන කාටත් අවංකව උදවු කළා. මම ඉන්නේ කණ්ඩායම් තීන්දුවත් එක්ක. නමුත් ලේකම්තුමිය හොඳ කාර්යභාරයක් සිදු කළා කාර්යශුරව. මම එතුමියට ගරු කරනවා. එතුමිය එතුමියගේ රැකියාව හරියටම කරනවා. අපි සියලු දෙනාම එකතු වෙලා සහෝදරත්වයෙන් මේ ප්‍රශ්නය විසඳා ගනිමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අද විශේෂ සභාවේ විශේෂ කාරණා කීපයක් කෙරෙහි අපි අදහස් දක්වද්දී විශේෂයෙන් දෙවෙනි කාරණය හැටියට අපේ ගරු මන්ත්‍රීතුමන්ලා 15 දෙනෙක් යොමු කළ ලිපියේ තිබුණේ ලේකම්තුමිය අපේ සභාවේ වාහනයක් පාවිච්චි කිරීම පිළිබඳව. පළමුවෙන්ම කියන්න ඕනෑ ඒ යෝජනාව කවුරු කොහොම දැක්කත් මම නම් ඒක වැදගත් යෝජනාවක් විදිහට දකින්නේ නෑ. නිශ්ඵල යෝජනාවක් හැටියට තමයි දකින්නේ. හේතුව අනෙත් සභා පිළිබඳවත් සොයා බැලුවොත් අපූරුවට උත්තර හොයාගන්න පුළුවන්, ඒ ලේකම්වරු සභාවේ වාහන පාවිච්චි කරන හැටි. අපේ සභාවේත් මට මතකයි ගාමිණී ගුණදාස මැතිතුමා මගේ පක්ෂයේ ඉස්සරලම හිටපු සභාපතිවරයා. ඊට පස්සේ හිටියේ අපේ විපක්ෂයේ සභාපතිවරු. අද අපේ වාහන විශාල ගණනක් තිබුණත් ලේකම්තුමිය කිලෝමීටර් 10 ක් 15 ක් ඈත තියා රාජකාරියට එන්න ඕනෑ. ඊට අමතරව තවත් රාජකාරි, රාජකාරි නියෝග මත ලැබිලා තියෙනවා. ඒ වගකීම් අපිට ඉෂ්ඨ කරන්න සිදු වෙනවා. ඒ අයට රජයෙන් දෙන අවම පහසුකම් භුක්ති විඳීම අවභාවිතාවක් වෙන්නේ නෑ. විශේෂයෙන්ම ආයතනයක රාජකාරි ඉටු කිරීමේදී යහපත් සේවයක් ඉටු කරන්න නම් මානසික තෘප්තිය තියෙන්න ඕනෑ. මම හිතනවා මේ සභාවේ පසුගිය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ අපි තීරණයක් ගත්තා අපේ සභා ක්ෂේත්‍රයේ වැදගත්ම සේවක කොටස හැටියට අපි කවුරුත් අගයන කුණු එකතු කරන කසල කම්කරු මහතුන් තෘප්තිමත් කරන්න යම් වැඩපිළිවෙළක් කරමුයි කියලා. අපි ඒ වැඩපිළිවෙළ යම් යම් ඡේද යටතේ වෙන් කරලා තිබෙන්නේ ඒ සුබසාධනයට ඉතාම වටිනා නිසයි. ඒ සේවය වඩාත් හොඳින් කරගන්න තමයි අපි ඔවුන් කෙරෙහි සොයා බලන්න තීරණය කළේ.ආයතනයක ප්‍රධානියෙක් වුනාම ගිනි ගොඩකට එනවා නම් එතන මහජන මන්ත්‍රී මණ්ඩලය 20ක් 30ක් ඉන්නවා නම් ඒ අභිලාෂය ඉටු කරන්න පුළුවන් වාතාවරණයක් නෑ. මම දකිනවා මෙතුමිය යනකොට උප කාර්යාලයට ගොඩවෙලා යන්නේ. පුස්තකාලයට ගොඩවෙලා යන්නේ.ගොවිපොල තිබෙනකොට ඒක බලාගෙන යන්නේ. එහෙම වාහනේ යන ගමන් තමන්ගේ රාජකාරි වේලාවෙන් පිටත රාජකාරී කරන අවස්ථා අපි දැකලා තියෙනවා. අපේ අනිත් මන්ත්‍රීතුමාලා එතුමියගේ වටිනාකම කිව්වා. ඒක අපි

කවුරුත් පිළිගන්නවා. එතුමිය රාජකාරියට එහා ගිය වගකීමක් ඉෂ්ඨ කළා.අපි මාසෙකට කීපවතාවක් කමිටුවලට ඇවිල්ලා මිනිස්සුන්ගේ ප්‍රශ්න කියලා ගියාම, ඒවා ඉෂ්ට සිද්ධ කරන ආයතනයේ සේවක මණ්ඩලය මෙහෙයවන්න, ඒ සම්පත් ඒ ආකාරයෙන් ලබා දෙන්න කටයුතු කරන්නේ ආයතනයක ආයතන ප්‍රධානියා. කිසිම නීත්‍යානුකූල අයිතියක් එතුමියට බලපාන්නේ නෑ. විශේෂයෙන් මේ සභාවේ සම්පත් පාවිච්චි කිරීමේ දී සභාවේ පූර්ණ වගකීමක් තියනවා නීතිය අතිනුත්, ගිණුම්කරණය අතිනුත්, අණපනත් අතිනුත්. අපට කෑගහලා, කතා කරලා, යෝජනා කරලා යන්න පුළුවන්. නමුත් ආයතන ප්‍රධානියෙකුට, සභාපතිවරයකුට එහෙම වැඩ කරන්න බෑ. පනත් කීපයක හිර වෙලා තිබෙනවා. රාජ්‍ය සේවා පනතින් හිර වෙලා තිබෙනවා. ආචාර ධර්මවලින් හිර වෙලා තිබෙනවා. ඒවා ඉෂ්ට කරන්න අපි එපා කිව්වට එහෙම නොකර ඉන්න බෑ. ඒක බරපතළ වරදක්. ඒ වරදට දඬුවම් දෙනකොට අපි නිදහස්. නමුත් වරදට මුහුණදෙන්න වෙන්නේ ඒ වගකීම් දරපු පුද්ගලයාට. ඒ නිසා මනා අවබෝධයකින් අපි මේ පිළිබඳව කටයුතු කළ යුතු වෙනවා. මේ සභා කාලයේ අද අවසාන සභා කාලය යන්නේ. හරිම කනගාටුවක් ඇති වෙනවා අපි ආපු ගමන් මග. විශේෂයෙන්ම බණ්ඩාර වැත්තෑව මැතිතුමාගේ කාලයේ ඉඳන් මේ සභාව නියෝජනය කරනකොට මොන පීඩනයකින්, වේදනාවකින්ද අපි මහජන ඉල්ලීම් ඉෂ්ට සිද්ධ කළේ. සන්ධ්‍යා සභාපතිතුමාත් එහෙමයි. ධර්මරත්න හේරත් සභාපතිතුමාටත් එහෙමයි. ඔබතුමියටත් එහෙමයි. ඒක මේ සභා කාලයේ අවාසනාව. වැඩ කරන්න තියෙන කාලය පොඩි පොඩි ප්‍රශ්න වලට මෙතෙන්ට ඇවිත් ගුටි කෙළ ගන්නවා, මතවාද ඇතිකරගන්නවා, මහජන සේවය පැත්තකට දාලා. ඒක මේ සභා කාලය තුළ මහජන නියෝජිතයින්ගෙන් නොවිය යුතු දෙයක් හැටියට මම කල්පනා කරනවා. ඒ නිසා මේ ටික කාලයේ හරි අපට නිවැරදි මාර්ගයකට අවතීර්ණ වෙන්න පුළුවන්. මේ විශේෂ සභාව තුල සාකච්ඡා කරලා විශාල අදහස් හුවමාරු කිරීම තුළ අපේ පීඩනය අඩුවෙලා අපට එක මතයකට ඇවිදින් මේ ඉතිරි කාලෙ හරි අපට මිනිස්සුන්ට තෘප්තිය ඇති වන ආකාරයට කටයුතු කරනවාද, තාමත් ගුටි කෙළ ගන්නවද කියලා මම ඔබතමුන්නාන්සේලාට සිහිපත් කරන්න ඕනෑ. අරගලයට අපි හැම පක්ෂයක්ම වගකිව යුතුයි. අපි හැම කෙනෙක් අතින්ම වැරදි වෙලා තිබෙනවා. ඒක හැටි. මිනිහෙකුට ඕනෑ වැරැද්දක් හදාගන්න කොන්දක් මිසක් වැරැද්ද වහගන්න වාචාල කටවල් නොවෙයි. මේ අපේ බල ප්‍රදේශයේ ඉන්න මිනිස්සු වෙනුවෙන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ලේකම්තුමියගේ ඇඟ උඩ යන්නේ වෙන ප්‍රශ්නයක්. ඒක අපි තේරුම් ගන්න ඕනෑ. ලේකම්තුමිය අයවැය ක්‍රියාවලියේ ගත්ත ක්‍රියාවලිය සේරම නීත්‍යානුකූලයි. එකක්වත් නීතියානුකූලභාවයෙන් පිට නෑ. මම එක දෙයක් කියන්නම්. සන්ධ්‍යා සභාපතිතුමාගේ කාලේ නිශ්ශංක ලේකම් මහත්මයාට චෝදනාවක් ආවා සභාපතිවරයාට පක්ෂ වැඩ කරනවා කියලා. එතුමා ඉන්පසු බණ්ඩාර වැත්තෑව මැතිතුමා සභාපති වුනාමත් එතුමා ඒ විදිහටම කළා. එතුමා රාජ්‍ය නිලධාරියෙක් හැටියට එතුමාට පැවරුනු කාර්යය ඉෂ්ඨ කලා. බණ්ඩාර වැත්තෑව මැතිතුමා සභාපති වුණාට පස්සේ එතුමා ඒ විදියටම වැඩ කළා. ඊට පස්සේ තමයි කට්ටියට තේරුනේ වැත්තෑව මැතිතුමා වෙනුවෙනුත් නිශ්ශංක මහත්මයා ඒ කාර්යභාරයම ඉටු කරනවා කියලා. රාජ්‍ය සේවකයෙක් හැටියටත්, පරිපාලනයේ ප්‍රධානියා හැටියටත් එතුමියගේ කාර්යභාරය තමයි ඉටු කරන්නේ. මේ අයවැය ක්‍රියාවලිය ඇතුලේ මෙතුමියන්ලා ගත්ත ක්‍රියාවලියේ කිසිදු අඩුලුහුඩුවක් වුණේ නෑ. ආයතන සංග්‍රහය ඇතුලේ කටයුතු කරගෙන යනකොට ලේකම්තුමියට වාහනය පාවිච්චි කරන්න නීත්‍යානුකූලභාවයක් තිබෙනවා ද කියන්න මම දන්නේ නෑ. හැබැයි මම හිතනවා එහෙම නීත්‍යානුකූලභාවයක් නැත්නම් මෙතුමිය වයඹ පලාතේ ඉන්න දක්ෂම ලේකම්තුමිය මේ ඉන්නේ. අද මේ අලව්ව ප්‍රාදේශීය සභාවට මෙතුමිය එපා නම් අනෙක් ප්‍රාදේශීය සභා ඔක්කොම බලෙන් භාරගන්නේ. කුලියාපිටියේ හිටියා, ඉතිහාසයේ කුලියාපිටියේ හිටපු හොඳම ලේකම්වරිය. ඊළඟට නාරම්මල ප්‍රාදේශීය සභාවේ අපිත් එක්ක වැඩ කළා. නාරම්මල ප්‍රාදේශීය සභාවේ සුමනසිරි සභාපතිතුමා දක්ෂ සභාපතිවරයෙක් කලේ මෙතුමිය. ගේන කිසි දෙයක් බෑ කියන්නේ නෑ. කරනවා. ඒ සභාවේ අපි හිටියා. එතරම් දක්ෂ

ලේකම්වරියකට තමයි මේ චෝදනාව එල්ල වෙන්නේ. හොඳම උදාහරණයක් ගත්තොත් පොල්ගහවෙල සභාවේ වැඩ කරනවා. මෙතුමිය පොල්ගහවෙල සභාවට යනකොට මේ වාහනය පොල්ගහවෙලට යන්නෙ නෑ. පොල්ගහවෙල කැබ් එක මෙතෙන්ට එනවා. උදේට එනකොට මෙතුමිය ගෙදර ඉඳන් මේ දක්වා ප්‍රාදේශීය සභාවට වැඩ කරන්න එන සියලුම සේවක මහත්තුරු මේකේ එක්කන් එනවා. හවසටත් ඒ ටික එක්කන් යනවා. අපි ලොකු බරපතළ කාරණාවක් කරනවා. මොකක්ද? මේ වගේ රාජ්‍ය සේවයේ නිලධාරීන් අඩුයි. වංචාව, දූෂණය නැති, කාර්යක්ෂමව තමන්ගේ රාජකාරියෙන් එළියේ වැඩ කරන කෙනෙක්ගේ මානසික චින්තනය බිඳලා දැම්මොත් ජාතික අපරාධයකට දායක වෙනවා. එහෙම දක්ෂ රාජ්‍ය නිලධාරියෙක් නිහඬ කිරීමෙන් ඒ අයගේ මානසිකත්වය බිඳ වැටීම ඇතිකිරීම අපි කරන ජාතික අපරාධයක්.එතනින් එහාට මට මොකටද මෙහෙම කරන්නේ. මගේ කාර්යභාරය විතරක් කරනවා කියලා හිතුවොත් අපි ඉවරයි. ප්‍රාදේශීය සභාවත් ඉවරයි. ඒ නිසා මම පැහැදිලිවම මෙතුමිය නීති විරෝධී කටයුත්තක් කරලා තිබ්බත්, රාජය සේවයේ වරදක් කරලා තිබ්බත් එම අධිභාරය දරන්නත් මේ වාහනය පාවිච්චි කරන එක අනුමත කරනවා. එහෙම වුණත් කමක් නෑ. මම ගෙවන්නත් අනුමත කරනවා.

තුන්වැනි කාරණය කතා කරන්න දෙයක් නෑ. යෝජනාව නීතියානුකූලයි. මට පුදුම හිතෙනවා තමුන්නාන්සේලා අත්සන් කළේ මොකටද කියලා. ඒකේ තමුන්නාන්සේලා දින 07ක කතාවක් කියනවා. ඊට පස්සේ කියනවා දින 03කින් කීව එකක් තමා දින 07 කින් කීවේ කියලා. ඒකේ ඔබතුමාලා කියන්නේ අයවැය ලේඛනයට විරෝධතා දැක්වීම දින 07 යි කියලා ලේකම්තුමිය කිව්වා. හැබැයි දින 03 කින් දෙන්න කියලා කියන්නේ. රීතියේ තියෙන විදිය බලන්න. රීතියේ තියෙනවා ඔබතුමාලා අයවැයට විරුද්ධ වීමට හේතු දක්වන්න ඕන දින 07 කින් හැබැයි කෙටුම්පතට සංශෝධන එකතු කරන්න ඕනේ දින 03 කින්. ඔය දෙක පටලාගෙන තිබෙන්නේ. ඒ හින්දා මේ කාරණයේ කතා කරන්නවත් දෙයක් නෑ ඒ කාරණේ පැහැදිලිවම නීත්‍යානුකූල වෙලා ඉවරයි. රීතිය අපිට ලැබිලා තියෙනවා.රීතිය අපිට කියවල තේරුම් ගන්න තියෙන්නෙ.රීතියේ විදියට වැඩ වුණේ නෑ කියලා අපට ලේකම්තුමියට චෝදනා එල්ල කරනවා කියන්නේ මන්ත්‍රීවරුන්ම හාස්‍යයට ලක් කිරීමේ කාරණාවක්. අපි හාස්‍යයට ලක් වෙනවා අපි රීතිය, පණත දැනගෙන ඉන්න ඕනෑ. ඔය කාරණේ කතා කරන්න දෙයක් නෑ. නීත්‍යානුකූලව අයවැය සම්මත වෙලා තිබෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සමගි ජන බලවේගය කණ්ඩායම විදියට අපි අපේ අදහස ප්‍රකාශ කරන්න තීරණය කළා. මොකද හේතුව මේ ලේකම්තුමිය සම්බන්ධව මේකට ඇතුල් වෙලා තිබෙන කාරණාත් එක්ක සභාවක් විදියට අපි දකින්නේ සභාපතිවරියත්, රාජ්‍ය අංශයේ පරිපාලන ප්‍රධානියා විදියට ලේකම්තුමියත්, මන්ත්‍රී මණ්ඩලය හා සේවක පිරිස මේක තමයි ව්‍යුහය. අපි මහජන නියෝජිතයො හැටියට ආවම අපට මුලින්ම ගිහින් පෙන්නුවෙ වාරියපොල ප්‍රාදේශීය සභාව. ලංකාවේ හොඳම වාරියපොල ප්‍රාදේශීය සභාව. හැම වෙලාවෙම ගසට පොත්ත සේ ලේකම්වරයාත් සභාපතිවරයාත් සිටිය යුතුයි. අපි දැක්ක දෙයක් තමයි සන්ධ්‍යා සභාපතිතුමා ඉන්න කාලෙත්, ධර්මරත්න හේරත් සභාපතිතුමා ඉන්න කාලෙත්, පද්මා වැත්තැව ගරු සභාපතිතුමිය ඉන්න කාලෙත් ලේකම්තුමිය සභාපතිවරයාට හැම වෙලාවෙම උපදෙස් දුන්නා. අපේ ප්‍රාදේශීය සභාවේ සේවක පිරිසගේ නායකත්වය දරන්නේ පරිපාලන නිලධාරී තුමිය. අපට මේකේ නිරවුල් කරගත යුතු පොඩි වැරැද්දක් තිබෙනවා. මම හිතන්නේ මේ නිරවුල් කරගත යුතු කාරණාව අපේ මොකක් හරි අඩුපාඩුවක් නිසා තමයි අපි අපහසුතාවයට පත්වෙන්නේ. මෙතැනදී ලේකම්තුමිය වාහනේ පාවිච්චි කිරීම සම්බන්ධව ගත්තොත් ඒක තමයි ප්‍රධාන මාතෘකාව. එතුමිය ගත්තොත් සිංහල අළුත් අවුරුදු කාලෙ, පොළ තිබෙන අවස්ථාවලදී එතුමිය රෑ 7ට 8ට ගෙදර යන්නෙ. අපි මේවා ලෙහා ගන්න ඕන ගැටළු. එතුමිය වෙසක් පොසොන් කාලවල සභාව සරසල නගරය බලලා ඒ වැඩේ ඉවර කරලා යද්දි රෑ බෝ වෙන්න පුළුවන්. එතුමියට එය ප්‍රවාහන පහසුකම් කෙසේ වෙතත් එතුමිය කන බොන වෙලාවට නොවෙයි වෙන්නැති කන්නේ

බොන්නේ. ඒ තරම් සේවාවක් කරනවා. එතුමිය ප්‍රාදේශීය සභාවන් ගණනාවක සේවය කරලා තිබෙන විශිෂ්ට ලේකම්වරියක් විදියට මේ සභාව දියුණු කරන්න ලොකු උත්සාහයක යෙදෙනවා. මේ වෙලාවේදි ලිහා ගන්න ඕන කාරණයක් තමයි අපි හැම වෙලාවෙම දන්නවා එල ඇති රුකට තමයි ගල් ගහන්නේ. ලේකම්තුමියට මේ වාහනය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සභා අනුමැතියක් අවශ්‍ය නම් ඒ සඳහා කිසිදු ගැටළුවක් නැතිව සභා අනුමැතිය අපි දෙනවා. කණ්ඩායමක් විදියට අපි සාකච්ඡා කළේ සිදුවන පුංචි අඩුපාඩුවක් තිබෙනවා නම් ඒ ටික අපි නිරවුල් කරගමු.අපි යෝජනාවක් දාමු මේ වාහනය දෙන්න සුදුසුයි කියලා. මේ අඩුපාඩුවක් තිබෙන නිසා තමයි මේ ගැටළුව පැන නැගුනේ. කවුරුත් මේ සිද්ධිය ඇතුලේ භේද වෙන්න අවශ්‍යතාවයක් නෑ. ලේකම්තුමිය කාන්තාවක් විදිහට යම් අපහසුතාවකට පත්වුණා නම් මම හිතනවා අපි මන්ත්‍රී මණ්ඩලය විදිහට ඔබතුමියගෙන් සමාව ගන්නවා. මොකද හේතුව කාන්තාවකට අපි දිය යුතු තැනක් තිබෙනවා. සභාපතිතුමියත් කාන්තාවක්. හැබැයි එතුමිය මෙතන මොන ප්‍රශ්න ආවත් ඇතෙක් වගේ ඉන්නවා. අපි හැමෝම ශක්තිමත් වෙලා තිබුන බැඳීමට වඩා හොඳ බැඳීමක් ඇති කර ගන්නත්, අලව්ව ප්‍රාදේශීය සභාව ලංකාවේ ඉදිරිපෙළට ගේන්නත් පුළුවන් ප්‍රාදේශීය සභාවක් කිරීමට අපි හැමෝම එකතු වෙලා කටයුතු කරමු. අපේ ප්‍රාදේශීය සභාව හෙට සිට අළුත් වෙලා අළුත් ප්‍රාදේශීය සභාවක් විදියට වැඩ කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රාජ්‍ය නිලධාරියකුට චෝදනාවක් එල්ල කරමින් සභාවට ලිපියක් ඉදිරිපත් කරලා පස්සේ අපි කොපමණ ප්‍රශස්ති ගී ගායනා කළත් වැඩක් නෑ. ප්‍රියන්ත සෝමසිරි මන්ත්‍රීතුමා සභාවට කරුණු දැක්වුවා මේ සිදුවුන කාරණයට සමාව අයදිනවා කියලා. අපි අගය කළ යුතු කාරණයක්. ලේකම්තුමිය සභාවේ වාහන පාවිච්චි කිරීම සම්බන්ධව දැනට අලව්ව ප්‍රාදේශීය සභාවේ පමණක් සිදුවන කාරණයක් නොවේ. මුළු ලංකාව පුරාම සිදු වන කාරණයක්. මීට පෙර මේ සභාවේ වැඩ කළ සියලු ලේකම්වරුන්ට මේ වරප්‍රසාදය ලබා දුන්නා. මෙවැනි දක්ෂ නිලධාරී නියක් මේ සභාවට අභිමානයක්. මින් ඉදිරියටත් එතුමිය ඒ වරප්‍රසාද ලබාදීමට අපි කටයුතු කළ යුතුයි, කියමින් එතුමියට යම් සිත් තැවුලක් උනානම් කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මේ යෝජනා දැම්මෙ මේවගේ තිබෙන නීත්‍යානුකූලභාවය මොකක්ද කියන එක සම්බන්ධයෙන් මිසක් එතුමියට විරුද්ධවවත්, වාහනයේ යන්න එපා කියන එකවත් නොවෙයි. තුන්වන කාරණයේ අයවැය සම්බන්ධව ලිපි යොමු කිරීමේදී මේක හිතා මතා සිදු කළ කාර්යයක්. මොකද අපට දින තුනකින් ලබා දෙන්න කියලා කිව්වෙ නෑ. අපි මේ ගෙනාව යෝජනා පෞද්ගලිකව ඔබතුමියන්ලට මඩ ගහන්න ගෙනාපු යෝජනා නෙවෙයි. මේකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ දැනගැනීමට මහජන නියෝජිත හැටියට අපිට අවස්ථාව ලබා දීම පිළිබඳව අපි ඔබතුමියට ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ NW PF-7468 දරණ කැබ් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පූර්ණ රක්ෂණය කර ඇති බැවින් එම කැබ් රථය සම්බන්ධයෙන් වූ විමර්ශන කටයුතු අවසන් වූ වහාම එනම් 2022/09/01 දින රක්ෂණ ආයතනයේ මැදිහත්වීමෙන් අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇත. මේවන විට එම අළුත්වැඩියා කටයුතුවල අවසන් අදියරයේ පවතින අතර මෙම වසර අවසන් වීමට පෙර නැවත එය සභාව වෙත රැගෙන ඒමට බොහෝ දුරට හැකිය. මේ සඳහා වන්දි ලබාදෙන ලෙසද ඉල්ලීම් කර ඇති අතර පළාත් පාලන ආයතනය සතු වාහන 06 කට

අලාභහානි කර තිබෙන බවට පළාත් පාලන කොමසාරිස්තුමාගේ නියෝග මත යාන්ත්‍රික ඉංජිනේරු ඇස්තමේන්තු සාදා ඔහුගේ අධීක්ෂණය මත කටයුතු සිදුවේ. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙන්ම යාන්ත්‍රික ඉංජිනේරු විසින් තක්සේරු වාර්තා ඉදිරිපත් කර ඇති අතර ඒවා අදාල ආයතන වෙත ඒ අය විසින් යොමුකර තිබේ. ඒ අනුව සභාව වෙත මෙතෙක් කිසිදු වියදමක් දැරීමට සිදුවී නොමැති අතර ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ හා රජයේ මැදිහත්වීම මත මේවන විට අළුත්වැඩියා කටයුතු සිදුවෙමින් පවතී.

මෙම සිද්ධි සම්බන්ධයෙන් සොයා බැලීමට විමර්ශන කොමිෂන් සභාවක් පත් කරලා තිබෙනවා. එම විමර්ෂණ කොමිෂන් සභාවටත්, මානව හිමිකම් කොමිෂන් සභාවටත් මේ පිළිබඳව අපි තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමාලට මතක ඇති සභාව පටන් ගන්න අවස්ථාවේදීම මේ ප්‍රශ්නය පැන නගින කොටම අපි කිව්වා අලව්ව පොලිසියේ පැමිණිල්ලක් දාලා ඒ පොලිසියේ සම්බන්ධතාවය ඇතුව කොල්ලුපිටිය පොලිසියේ පැමිණිල්ලක් දාලා ඒ අනුව මේක උසාවියට ඉදිරිපත් වෙලා තිබෙනවා. උසාවියේ ඒක ප්‍රශ්න කරමින් යනවා. අපිව සම්බන්ධ කරගන්නේ නෑ. ඒ සිදුවන දේවල් සම්බන්ධයෙන් එම පොලිසිය තමයි කටයුතු කරගෙන යන්නේ. ඒ ආකාරයට මේ වාහනය යථා තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඉතා ඉක්මනින් අපට ආයතනයට ආපසු ගෙනත් දෙන්න පුළුවන් වෙනවා. යාන්ත්‍රික ඉංජිනේරු විසින් නිතරම වාහනය අධීක්ෂණය කරනවා ඔහු එතෙන්ට ගිහින් බලනවා. වාහනය කටයුතු හරියට සිදු වෙනවාද, මොනවද අලුතෙන් දාන්නෙ කියන එක සම්බන්ධව. ඒ පිළිබඳ වගකීමකින් තමයි ඒ කටයුතු කෙරෙන්නේ. ඔබතුමාලා කිව්වා මේක ගැන පැහැදිලි විස්තරයක් කළේ නෑ කියලා. එදා සභාවට වාහනය පිළිබඳ කරුණු ඉදිරිපත් කර කරුණු පැහැදිලි කරද්දී විවිධ මන්ත්‍රීවරු තම තමන්ගේ අදහස් කියමින් කෑ ගසද්දී එක් මන්ත්‍රීතුමියක් එකවරම නැගී සිට සභාපතිට තව සතියක් ඇතුලත බන්ධනාගාරගතවීමට සිදු වෙනවා. මෙම වාහනය සඳහා ඒ අයට අධිභාරය ගෙවන්න සිදු වෙනවා. තමන් ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කරනවා කියලා කීවා. ඒ සමඟම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ තවත් මන්ත්‍රීවරු 09 දෙනෙකු එම අදහසම පලකලා. ඒ වෙලාවේ මම කීවා ඔබතුමන්ලගෙන් සත පහක්වත්, මේ සභාවේ මුදල්වත් වියදම් වෙන්න ඉඩ තියන්නේ නෑ, මට කොයි දේ නැති උනත් කමක් නෑ, මගේ සහ මගේ පවුලේ අයගේ දේපළ විකුණලා හරි එහෙම මුදලක් අවශ්‍ය වුනොත් ගෙවනවා කියන එක. ඒ වෙලාවෙදි සභාවේ කටයුතු අතරමැද ලිපියක් ඉදිරිපත් කළා ඒ පිළිබඳව කතා කරන්න අවශ්‍යයි කියලා. ඊට පස්සේ කිව්වා එක යෝජනාවක් විදිහට දාන්න එපා වෙනත් කරුණු යටතේ කතා කරනවා කියලා. වෙනත් කරුණු යටතේ කතා කරන්න අවස්ථාව දුන්නා. සභා වාහනය ඉතා හොඳ තත්වයෙන් ඉතාම කෙටි කාලයකින් සභාවට ලබා දෙනවා.

අලව්ව ප්‍රාදේශීය සභාවේ මීට පෙර කටයුතු කළ ලේකම්වරුන් මෙන්ම වයඹ පළාතේ අනිකුත් සියළු පළාත්පාලන ආයතනවල ලේකම්වරුන් විසින් වාහනය භාවිතා කරන අතර ඒ අනුව අප සභාවේ ලේකම්තුමිය ද වාහනය භාවිතා කරන බව දන්වා සිටිමි.

මම ඇවිල්ලා මට උදව් ගන්න වාහනය දුන්නා නෙවෙයි. මම සභාපති ධුරයට පත් වෙනකොට මේ වයඹ පළාතේ අනෙකුත් සියලුම පළාත් පාලන ආයතන වල ලේකම්වරුන් ට ඒ වාහන භාවිතා කිරීම සඳහා අවස්ථාව ලබා දීලා තිබෙනවා. අනිකුත් ලේකම්වරුනුත් ඒ වගේම වාහන භාවිතා කරනවා. මෙතුමිය කටයුතු කරන හැටි ඔබ හැම දන්නවා. උදේ 08.00 ත් 08.15 ත් අතර සභාවට ඇවිත් සවස 04.30 සමහරවිට 05.00, 05.30 වෙනකනුත් වැඩ කරනවා.අපි හැම දෙනෙක්ම සහ මහජනතාව ඉදිරිපත් කරන ප්‍රශ්න පිළිබඳ ගත් තීරණ සහ ඒ අනුව නිලධාරීන් කටයුතු කරන ආකාරය ගැන විමසිලිමත් විය යුතුයි. එක් දවසකට සභාවේ ලියවිලි රාශියකට නිර්දේශය, අනුමැතිය දීමට අත්සන් කල යුතුයි. සමහර වෙලාවට අපි දකිනවා විශාල ලිපි ගොඩක් අරගෙන තමයි 4:30 ට 05.00 ට විතර මෙහෙන් පිටත් වෙන්නේ. ඒ ටික අරගෙන නිවැරදි කරගෙන ඒ කටයුතු සම්පූර්ණ කරගෙන තමයි ආපහු පහුවදාට එන්නේ. යන අතරමඟදී රාජකාරි වලට අදාල වන දේවල් පිළිබඳවත් හොයලා බලාගෙන යනවා. ඒත් එක්කම මම

කියන්න ඕන මට කිසිම පෞද්ගලික හිතවත්කමකින් උදව්වක් ලබා ගැනීමට මම ලේකම්තුමියව හෝ එතුමිය මාව හෝ භාවිතා කරලා නෑ. සමහර මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා ඉදිරිපත්කරන රාජකාරී ලිපි දැනුවත්කමින් හෝ නොදැනුවත්කමින් ද දන්නේ නෑ ලිපියට අත්සන් තබන ඒ අයටම තමන්ගේ තනතුරු පවා අහිමි වන තැනට කටයුතු යෙදෙනවා. නමුත් ඒවා ගැන කතා කරලා එම ගැටළු හෙමින් විසඳගමු කියලා ඒ මන්ත්‍රීතුමාලව තුමියන්ලව දැනුවත් කර උදව් කරනවා. ඒ ප්‍රශ්න වලට අමතරව නිලධාරීන්ගේ යම් යම් ගැටළුත් මේ හැම දෙනාගේම ප්‍රශ්නත් එක්ක තමයි මේ ලේකම්තුමිය රාජකාරි කටයුතු කරන්නේ. ඒ තැන්වලදී ඉතාම ඉවසිල්ලෙන් කටයුතු කරන කෙනෙක් හැටියට තමයි ඔබතුමන්ල වගේම මමත් දකින්නේ. ඊයෙත් මම කිවුවා මාව මෙතනින් අයින් කරගන්න අවශ්‍යතාවයක් තිබෙනවා නම්, මාත් එක්ක තිබෙන තරහක් හෝ ක්‍රෝධයක්, ඉරිසියාවක්, වෛරයක්, නම් එතුමියට එක දශමයක හානියක් වෙන්න ඉඩ තියන්න එපා. මොකද කුලියාපිටිය නගර සභාව එතුමිය ඉල්ලනවා මේ වෙනකොට. පොල්ගහවෙල සභාවේ ලේකම්තුමා අසනීප වෙලා මාස 6 ක් 7 ක්. එතුමාට එන්න වෙන්නෙ නෑ. එහෙන් මෙතුමියව ඉල්ලනවා. අපිට ආරංචියක් ආවා අද සභාවේදි ලේකම්තුමියව දැඩි අපහසුතාවයට ලක් වුණොත් හෙටම කුරුණෑගල සභාවට ස්ථාන මාරුවක් ලබා දෙනවා කියලා. ඒ නිසා එතුමිය ගියොත් මේ සභාව මහා පරිහානියකට පත් වෙනවා. එතුමියව යවන්න එපා. මාව නම් ලොකුම හිසරදය මම කාටවත් බයේවත්, බොරු චෝදනා වලට මුහුණදෙන්න බැරිකමකටවත් නෙවෙයි. මගේ අතින් වැරැද්දක් සිද්ධ වෙලා නෙවෙයි. ලේකම්තුමියත් අපහසුතාවයට පත් කරන්නේ මාව පීඩාවට ලක්කිරීමට නම් ඇය වෙනුවෙන් මම මේ සභාවෙන් ඉවත් වෙන්න වුණත් සූදානම් කියන එක ප්‍රකාශ කරනවා. මාත් එක්ක තියෙන ඊර්ෂ්‍යාවට මගේ පවුලේ අයගේ දේපල විනාශ කෙරුවට එම ඊර්ෂ්‍යාව පිටස්තර කෙනෙකුගේ රැකියා පහසුකම් වලට බලපෑමට මම ඉඩ තියන්නේ නෑ.

මීළඟට ඔබතුමාලා ඉදිරිපත් කලේ අයවැය ගැන.

අයවැය කෙටුම්පත සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව 2020/10/28 වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇති රීති මාලාවේ 12(5) වගන්තියේ නියමයන් අනුව විපක්ෂව ඡන්දය ලබාදීමට හේතුව දින 07 ක් ගතවීමට පෙර ලිඛිතව පළාත් පාලන කොමසාරිස්ට පිටපතක් සහිතව ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු බවට නියම කර ඇත. ඒ අනුව එම නියමය අනුගමනය කර ඇති අතර උක්ත රීති සංග්‍රහයේ 11(1) වගන්තියට අනුව දක්වා ඇත්තේ සභාපතිවරයා විසින් අයවැය යෝජනාව න්‍යාය පත්‍රය සමග යොමුකිරීමෙන් අනතුරුව දින 03 ක් ඇතුලත සංශෝධන ඇත්නම් ලබාදන ලෙසය. ඒ අනුව කිසිදු සංශෝධනයක් ඉදිරිපත් කර නොමැති අතර ඒ බව අයවැය පලමුවර හා දෙවන වර ඉදිරිපත් කිරීමේදි නිවේදනය කර ඇත. මේ සම්බන්ධයෙන් වූ රීති සංග්‍රහයද ඔබ සියළු දෙනා වෙත ලබාදී ඇති අතර අයවැය සකස් කිරීමේ කටයුතු සියල්ල එම රීති මාලාවේ සියළු විධිවිධානයන් නිවැරැදිවම අනුගමනය කර ඇත.

ඒ විතරක් නොවෙයි, මේ පිළිබඳ පළාත් පාලන කොමසාරිස් තුමාට යවලා කොමසාරිස්තුමාගේ කාර්ය මණ්ඩලය, ආණ්ඩුකාරතුමා ඒ කාර්ය මණ්ඩලය ඒවා කියවලා බලලා ඒ අයගේ වගකීම ඇතිව තමයි මේ තීන්දුවට ඇවිල්ලා තිබෙන්නේ. මට මතකයි මේ සභාවේ අයවැයට මාස ගණණාවකට  කලින් ඉඳලා මේකට සූදානම් වුණා කියලා. අයවැය මාසෙන් මාසෙට ලැබෙන අය හා වැය දිහා බලලා ඒවා සූදානම් කරනවා මිසක් මාස 6 කට ඉස්සර මේක පරද්දන්න ආවොත් මෙහෙම ගහන්නේ කියලා මේවට සූදානම් වෙන්න බෑ. ඒ වගේම මම මේක අවස්ථාවක් කරගන්නවා සමගි ජන බලවේගයේ මන්ත්‍රීතුමන්ලා එදා මට විශාල සහයෝගයක් දුන්නා. ඒ වගේම අපේ මන්ත්‍රීවරු කොටසකුත් මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ වගේම කාර්ය මණ්ඩලය රාජකාරී කටයුතු කරගෙන යාමේදී විශාල සහයෝගයක් ලබා දෙනවා. ඒත් එක්කම රටේ නොසන්සුන්තාවයක් ඇතිවුණා. ඒක ඔබතුමාලා දන්නවා. දෙසැම්බර් මාසය වන විට හැම පක්ෂයක් තුළම පොඩි පොඩි නොසන්සුන්තාවයන් තිබුණා අපට මතකයි. හැම වෙලාවෙම අවට උද්ඝෝෂණ තිබුණා. රැස්වීම් පැවැත්වුනා. ඒ වගේ කටයුතු කෙරෙද්දී ඔබතුමන්ලාට ස්තූති කිරීම සඳහා එකතු කර ගන්න තරම් හැකියාවක් ලැබුනේ නෑ. මගෙන් එවැනි අතපසුවීමක් උනානම් ඔබතුමාලා ගෙන් සමාව ඉල්ලනවා. මගේ ජීවිතයේ තියෙන තුරු කවුරු හෝ මට දශමයක් හරි සහයෝගයක් දුන්නා නම් ඒ සඳහා කෙළෙහි ගුණය මගේ ජීවිත

කාලය තුලම තිබෙනවා . ඔබතුමන්ලා කිව්වා වගේ ඔබ සැම එකඟ වෙනවා නම්, එකඟ වුණත්, නොවුණත් ජනතාව වෙනුවෙන් අපි කටයුතු කළ යුතුයි. මට පක්ෂ භේදයක් නෑ. කරන්න පුළුවන් උපරිම සේවය ඔබ සැම වෙනුවෙන් කරන්න මම සූදානම්.

**නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

අද දිනට නියමිත විශේෂ මහ සභාවේ න්‍යායපත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පල කරනවා.ලබන්නා වු 2023 නව වසර සියළු දෙනාටම වාසනාවන්ත නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරමින් අද දිනට නියමිත විශේෂ සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව. 2.00ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/12/14
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.